MILCO

දේශයේ අභිමානය

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

## 2011-2012



### අපගේ දැක්ම

ශ්‍රී ලංකාව තුළ විශිෂ්ඨතම පෝෂණීය ආහාරපාන
සමාගම ලෙස ස්ථාපිත කිරීම

### අපගේ මෙහෙවර

ශ්‍රී ලංකාව නැවුම් කිරිවලින් ස්වයංපෝෂිත කර මව් කිරෙන් පසු
විවිධ වර්ගයේ පෝෂණීය ආහාර සෑම ජන කොටසකටම හා සෑම
වයස් කාණ්ඩයකටම ලබාදීම

# පටුන


| | |
|---|---|
| සංස්ථානික තොරතුරු | 1 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 2 - 3 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 4 - 5 |
| සංස්ථානික පාලනය | 6 |
| විගණන කමිටු වාර්තාව | 7 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | |
| විගණකවරුන්ගේ වාර්තාව | 8 - 9 |
| ආදායම් ප්‍රකාශය | 10 |
| ශේෂ පත්‍රය | 11 |
| හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 12 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 13 |
| මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් | 14 - 34 |
| මූල්‍ය විශේෂතා | 35 |

# ආයතනික තොරතුරු

| | |
|---|---|
| සමාගමේ නම | - සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම |
| නෛතික තත්ත්වය | - 1982 සමාගම් පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත සීමාසහිත වගකීම් සහිත පුද්ගලික සමාගමකි. |
| ලියාපදිංචි කාර්යාලය | - අංක 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.<br>- දුරකථන 0112586174, 0112582331-4, 0112586872<br>- ෆැක්ස් 0112368082, 0115333328, 0112590334<br>- වෙබ් අඩවිය www.milco.lk<br>- විද්‍යුත් තැපැල info@milco.lk |
| කර්මාන්තශාලා | - කොළඹ කිරි කම්හල<br>- අඹේවෙල විසිරි වියළි කිරි කම්හල<br>- දිගන කිරි කම්හල<br>- පොළොන්නරුව උකු කිරි කම්හල |
| සංස්ථාගත කළ දිනය | - 1996 මැයි 09 |
| ප්‍රති ලියාපදිංචි කළ දිනය | - 2008 මැයි 19 |
| සමාගම් ලියාපදිංචි අංකය | - N (PVS) 17159 (පැරණි)<br>- PV 2942 (නව) |
| සමාගම් ලේකම් | - ෆිනෑන්ෂියල් සර්විසස් ඇන්ඩ් කොමර්ෂල් එජන්සීස්<br>අංක 28, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07. |

| අධ්‍යක්ෂවරු | | |
|---|---|---|
| | - සුනිල් වික්‍රමසිංහ මයා | සභාපති |
| | සංජය ලීලාරත්න මයා | නියෝජ්‍ය සභාපති |
| | නව්ෂාද් ජුනෙයිදීන් මයා | අධ්‍යක්ෂ |
| | ආර්. සිවරාම් මයා | අධ්‍යක්ෂ |
| | එස්. ලෝගනාදන් මයා | අධ්‍යක්ෂ |
| | අජිත් දිසානායක මයා | අධ්‍යක්ෂ |
| | තිලංක වීරසිංහ මයා | අධ්‍යක්ෂ |
| | දශිකා එඩ්වඩ් මිය | අධ්‍යක්ෂ |
| | ඩබ්.පී.ආර්.එච්. පණ්ඩිතරත්න මයා | අධ්‍යක්ෂ |

| | |
|---|---|
| විගණකවරු | - අභ්‍යන්තර<br>එස්.ජේ.එම්.එස්. ඇසෝසියේට්ස්, අංක 02, කාසල් පටුමග, කොළඹ 04<br>- බාහිර<br>බී.ඩී.ඕ. පාටිනර්ස්, අංක 65/2, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. |
| බැංකුකරුවන් | - මහජන බැංකුව<br>ලංකා බැංකුව |

2012 මාර්තු 31න් අවසන් වන වර්ෂය සඳහා මෙම සමාගමෙහි කාර්යසාධනය ගැන සමාලෝචනයක් මා ඉදිරිපත් කරන්නේ ඉමහත් සන්තෝෂයෙනි.

මෙම වසර සඳහා යහපත් මූල්‍ය කාර්යසාධනයක් අඛණ්ඩව පවත්වා ගැනීම ඉතාම අපහසු විය. නැවුම් කිරි සඳහා ගොවීන්ට ගෙවන මිල වැඩි කිරීමට එළඹුන අර්ථවත් දුරදක්නා තීරණය සහ මිල්කෝ කාර්යමණ්ඩලය වෙහෙස නොබලා කටයුතු කිරීම නිසා මෙතෙක් නොවූ විරූ අන්දමේ නැවුම් කිරි නිෂ්පාදන වර්ධනයක් වසර තුළ ඇති විය.

නැවුම් කිරි සඳහා ගොවීන්ට ගෙවූ මිල 57%කින් වැඩි වුව ද, මිල්කෝ සමාගම අගනා මෙහෙවරක් ඉටුකරන ආයතනික පුරවැසියකු වශයෙන් තම අමාත්‍යාංශයේ ද උපදෙස් ඇතිව මාස කිපයක් ම නිෂ්පාදන විකුණුම් මිල නොවෙනස්ව තබා ගැනීමට වැදගත් තීරණයක් ගත්තේ ය. වසර මැද ඉන්ධන මිල ඉහළ යාම නිසා නිෂ්පාදන මිල තවදුරටත් වැඩි විය.

අලෙවි කළ භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය වැඩි වීම නිසා සමාලෝචනයට භාවිත වන වසර තුළ පාඩුව රුපියල් මිලියන 226ක් විය.

කෙසේ වුව ද, සමාගමේ පිරිවැටුම මෙම වසර තුළ 16%කින් වැඩි විය. 2010/2011 වසර සඳහා පිරිවැටුම රුපියල් බිලියන 4.548ක් වූ අතර, සමාලෝචිත වසර තුළ පිරිවැටුම රුපියල් බිලියන 5.263ක් විය.

### කිරිපට්ටි සංවර්ධනය සහ කිරි එකතුව

මෙම වසර කිරිපට්ටි සංවර්ධනය සඳහා සුවිශේෂී වසරක් විය. මෙය "කිරි ඉතුරුන" විප්ලවයක් ඇති වූ වසරකි. නැවුම් කිරි සඳහා ගොවීන්ට ගෙවූ මිල පූර්ණ ඝන ද්‍රව්‍ය පදනම් කොට ගෙන ලීටරයට රු. 50/-ක් විය. මෙය අන්තර්ජාතික මිලට අඩු නොවී ය. එමගින් කර්මාන්තය වාණිජකරණයට පත් විය. වැඩියෙන් ම කිරි නිෂ්පාදනය කළ සෘතුවේ දී නිෂ්පාදනය දිනකට ලීටර් 230,000 දක්වා වැඩි වීමෙන් කම්හල්වල "කිරි උතුරා" ගියේ ය.

ග්‍රාමීය ප්‍රජාව සහ වැවිලි කර්මාන්තය ආශ්‍රිත ජනතාවගේ ආර්ථික තත්ත්වය නංවමින් දිවයිනේ කිරිපට්ටි ගොවීන්ට මිල්කෝ සමාගම රුපියල් බිලියන 3.47ක් ගෙවා ඇති බව අපි සතුටින් සිහිපත් කරමු.

### කිරි එකතුව

| වර්ෂය | ලීටර් මිලියන | වර්ධනය (%) |
|---|---|---|
| 2007 | 54 | |
| 2008 | 53.5 | - 0.95 |
| 2009 | 54.9 | 2.47 |
| 2010 | 55.5 | 1.19 |
| 2011 | 52.8 | - 5 |
| 2012 | 68.5 | 30 |

### නැවුම් කිරිවල ගුණාත්මකභාවය

කිරිවල ගුණාත්මකභාවය කවරහෙයකින්වත් අඩු කිරීමට ඉඩ තැබුවේ නැත.

ගොවීන් ගෙනවුත් බාරදෙන නැවුම් කිරිවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට සෑම උත්සාහයක් ම දරන ලදී. මිල්කෝ කම්හල්වලට ලැබෙන නැවුම් කිරිවල ගුණාත්මකභාවයෙහි පැහැදිලි දියුණුවක් දක්නට ලැබුණි. මෙම අරමුණ ඉටුකර ගැනීමෙහි ලා මිල්කෝ කිරිපට්ටි සංවර්ධන ක්ෂේත්‍ර කාර්යමණ්ඩලය විශේෂ මෙහෙවරක් ඉටු කළේ ය.

### විකුණුම් හා අලෙවිකරණය

කිරි නිෂ්පාදන බෙදා හැරීමට දිවයින පුරා බෙදාහරින්නන් 101ක් මිල්කෝ සමාගම සඳහා සේවය කරති. අලෙවි කාර්යමණ්ඩලයට අලෙවි නියෝජිතයන් 28 දෙනෙක් ද, ප්‍රදේශ කළමනාකරුවන් 10 දෙනෙක් ද, පරිපාලන නිලධාරීන් 6 දෙනෙක් ද ඇතුළත් ය. මෙයට අමතර ව 55 දෙනෙකුගෙන් යුත් කාර්යමණ්ඩලයක් සේවය කරන අලෙවි මධ්‍යස්ථාන 11ක් මිල්කෝ සමාගම විසින් පිහිටුවා තිබේ. මෙම කර්තව්‍ය සඳහා දිවයින කලාප 10කට බෙදා ඇත. නිෂ්පාදන නව්‍යකරණය සහ නවෝත්පාදනය අඛණ්ඩව සිදුවේ. සියළුම සිල්ලර අලෙවි ස්ථානවල දී සියළු

පාරිභෝගිකයන්ට මිල්කෝ නිෂ්පාදන ලැබීම සහතික කිරීමට නව බෙදා හරින්නන් පත්කොට දිවයින පුරා බෙදා හැරීම වැඩි කිරීම අපගේ අරමුණයි. මේ අනුව අපගේ අනාගත දැක්ම වන්නේ සිල්ලර අලෙවි සැල් සංඛ්‍යාව 50,000 දක්වා ද, බෙදාහරින්නන් සංඛ්‍යාව 400 දක්වා ද, බෙදාහැරීමේ වාහන සංඛ්‍යාව 140 දක්වා ද, වැඩි කිරීම ය.

**මිල්කෝ කාර්යමණ්ඩලය**

සියළුම ගනවලට අයත් කාර්යමණ්ඩල සාමාජිකයන් 1470ක් මිල්කෝ සමාගමෙහි සේවය කරති. සුබසාධන කටයුතු මගින් කාර්යමණ්ලයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමේ අරමුණ ඇතිව මෙම වසර තුළ ප්‍රගතිශිලි පියවර කීපයක් ම ගන්නා ලදී. සෞඛ්‍ය රක්ෂණය යටතේ රෝහල්ගත ප්‍රතිකාර සඳහා ගෙවීම රු. 50,000/- සිට රු. 125,000/- දක්වා වැඩි කළ අතර, විදේශගත ප්‍රතිකාර සඳහා රු. 625,000/- ක් ද, කලින් ආවරණය නොවූ තීරණාත්මක අසනීප 25ක් සඳහා රු. 500,000/- බැගින් ද ගෙවීම අනුමත විය. සියළු සේවකයන් සඳහා ජීවනවියදම් දීමනාව රු. 15,000/- කින් වැඩි කරන ලදී.

**ඉදිරි මග**

ශ්‍රී ලංකා ජනතාවට පෝෂ්‍යදායි ආහාර සැපයීමට මිල්කෝ සමාගම කැපවී ඇත. දැනට පවත්නා කර්මාන්තශාලා යන්ත්‍ර අවුරුදු 50කට වඩා පැරණි වන බැවින් DESMI Contracting Agency සමග අඹේවෙල, දිගන සහ පොලොන්නරුව කම්හල් නවීකරණය සඳහා වාණිජ ගිවිසුමකට අත්සන් තබන ලදී. පිරිවැය යුරෝ ඩොලර් මිලියන 33.8කි. නවීකරණය කරන ලද කම්හල්වල දෛනික ධාරිතාව දිනකට ලීටර් 320,000 සිට ලීටර් 700,000 දක්වා වැඩි වනු ඇත. කොළඹ කර්මාන්තශාලාව, බඩල්ගම ජාතික පශුසම්පත් සංවර්ධනය මණ්ඩලයේ ගොවිපල ඉඩමෙහි ප්‍රතිෂ්ටාපනය කරනු ඇත. ඉන් පසු එහි ආරම්භක නිෂ්පාදන ධාරිතාව දිනකට ලීටර් 200,000ක් වනු ඇත. නව කම්හල ඉදිකිරීමෙන් පසු නව පෝෂ්‍යදායි ආහාර වර්ග නිපදවීමේ අවස්ථාව මිල්කෝ සමාගමට ලැබෙනු ඇත.

**සාමාන්‍ය**

විශේෂයෙන්ම දියර කිරි සඳහා සංනම ව්‍යාප්ත කිරීමට අදාල අලුත් නිෂ්පාදන ඉදිරිපත් කිරීම අතින් නව නිෂ්පාදන සංවර්ධන අංශය විශාල දියුණුවක් ලබා ඇත. නිමි නිෂ්පාදන බෙදා හැරීමේ ජාලය වැඩිදියුණු කිරීමේ මූලික කටයුතු සලසා තිබීම ඉදිරි නවීකරණ ක්‍රියාවන් ආරම්භ කිරීමට වැදගත් වේ.

අපගේ අගනා පරිභෝජන ප්‍රජාව අතර "හයිලන්ඩ්" වෙළෙඳ නාමය ජනප්‍රිය කිරීම උදෙසා වෙළෙඳ නාම වර්ධනය සහ අලෙවියට අදාළ කටයුතු කිරීමට නව කාර්යමණ්ඩලය බඳවා ගැනීම වැදගත් ය.

නැවුම් කිරි අලෙවිය සුවිශේෂී ලෙස ඉකුත් වසරට වඩා 30%කින් වැඩි විය. එමගින් නැවුම් කිරි සම්බන්ධයෙන් ස්වයංපෝෂණය කිරීමෙහි මාවතෙහි ඉදිරි ගමන සහතික කරන ලදී. මෙරට නැවුම් කිරි නිෂ්පාදනය වැඩි කිරීමට ක්‍රියාමාර්ග රාශියක් පශුසම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය ආරම්භ කර ඇත. මෙරට ගව සම්පතෙහි ජානමය පොහොසත්කම වැඩි කිරීමට සහ දේශිය නිෂ්පාදනය වැඩි කිරීමට උසස් අභිජනන ශක්තියක් ඇති ගවයන් ආනයනය කිරීම ආරම්භ වී ඇත.

අවසාන වශයෙන් අපට නන් අයුරින් ආධාර කළ ගරු ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමාට ද, අමාත්‍යාංශයේ ලේකම් තුමාට ද, අමාත්‍යාංශයේ සියළු කාර්යමණ්ඩලයට ද මිල්කෝ සමාගම සහ විශේෂයෙන් කිරි කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා අතහිත දුන් සියළු ගණයන්හි පුද්ගලයන්ට ද මිල්කෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම කෘතඥ වෙමි.

සුනිල් වික්‍රමසිංහ
සභාපති
සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගම
2013 ජනවාරි 31.

### අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

2012 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මිල්කෝ පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණනය කළ මුදල් වාර්තාව සතුටින් ඉදිරිපත් කරමු.

### ප්‍රධාන කාර්යය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වුයේ නැවුම් කිරි එකතු කිරීම, පිරිසැකසුම, ඇසුරුම් කිරීම, බෙදාහැරීම සහ කිරි නිෂ්පාදන අලෙවි කිරීමයි.

### ව්‍යාපාර කටයුතු සමාලෝචනය

වාර්තාවේ අත්‍යවශ්‍යම අංගයක් වන සභාපතිගේ සමාලෝචනය 2012.03.31 දිනෙන් අවසන් වු වර්ෂය තුළ සමාගමේ මෙහෙයුම් පිළිබඳ විස්තරාත්මක කරුණු ඉදිරිපත් කිරීමක් වේ.

### දේපළ පිරියත හා උපකරණ

වර්ෂය තුළ දේපළ පිරියත සහ උපකරණවල අමතර එකතු කිරීම් රුපියල් මිලියන 422.1ක් වන අතර, ක්ෂය කිරීම් පෙන්වා දී ඇති පරිදි වේ.

### අධ්‍යක්ෂ මණ්ඩලය

පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් පහත සඳහන් මණ්ඩලය 2010 මැයි 13 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.
සුනිල් චන්ද්‍ර සිල්ලපන වික්‍රමසිංහ මයා - සභාපති
කන්කානම්ගේ සංජය ලිලාරත්න මයා - නියෝජ්‍ය සභාපති
මොහමඩ් නෞෂාඩ් ජුනයිදීන් මයා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
රාජු සිවරාමන් මයා M.Sc (Arch) FIA (ශ්‍රී ලංකා) - අධ්‍යක්ෂ -
සෙල්වදුරෙයි ලෝගනාදන් මයා FCMA (UK) FSCMA (ශ්‍රී ලංකා) - අධ්‍යක්ෂ -
ආචාර්ය අජිත් දිසානායක මයා - අධ්‍යක්ෂ
තිලංක වීරසිංහ මයා - නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්, දිවුරුම් කොමසාරිස් - අධ්‍යක්ෂ
අරිනේසරාජා ශක්තිවේල් මයා පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කෘෂිකර්මය) ආර්ථික විද්‍යා (එක්සත් රාජධානිය) B.D. (පශු) පේරාදෙනිය - අධ්‍යක්ෂ .
රත්නතිලක ලේකම්ගේ මයා - අධ්‍යක්ෂ

ඉහත දැක්වූ මණ්ඩලයෙන් පහත නම් සඳහන් අධ්‍යක්ෂවරු මෙහි දැක්වෙන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වුහ.
අරිනේසරාජා ශක්තිවේල් මයා - 2010 දෙසැම්බර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි.
රත්නතිලක ලේකම්ගේ මයා - 2010 දෙසැම්බර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි.
ඉහත සඳහන් පරිදි ඉල්ලා අස් වු අධ්‍යක්ෂවරුන් වෙනුවට පහත නම් සඳහන් අධ්‍යක්ෂවරු දෙදෙනා පත්විය.
දනුක දික්වැල්ල මයා - 2010 දෙසැම්බර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි
දශිකා එඩ්වර්ඩ්ස් මිය - 2011 ජනවාරි 12 දින සිට බලපැවැත්වෙන පරිදි
පහත නම් සඳහන් අධ්‍යක්ෂවරයා මෙහි දැක්වෙන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය.
දනුක දික්වැල්ල මයා - 2011 අප්‍රේල් 26 දින සිට බලපැවැත්වෙන පරිදි
ඉල්ලා අස් වු ඉහත නම් සඳහන් අධ්‍යක්ෂවරයා වෙනුවට පහත නම් සඳහන් අධ්‍යක්ෂවරයා පත්කරන ලදී.
ඩබ්.පී.ආර්.එච්. පණ්ඩිතරත්න මයා - 2011 අප්‍රේල් 26 දින සිට බලපැවැත්වෙන පරිදි

### කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ප්‍රමාණයෙන් සහ අගයෙන් රුපියල් මිලියන 319.4ක් විය.

### සංචිත

ඉදිරියට ගෙන ආ සමුච්චිත ලාභය වන රු. 1,191,278,978 වර්තමාන වර්ෂයේ බදු අය කිරීමෙන් පසු ශුද්ධ අලාභය වන රු. 226,438,585ට ගලපන ලදුව අදාළ තොරතුරු ගිණුම් ප්‍රකාශයේ 3වන පිටුවෙහි දැක්වේ.

වසර අවසානයේ පැවති ප්‍රාග්ධන සංචිතය වන රු. 25,000,000 සහ නිදන් අරමුදල වන රු. 1,689,978 සංචිතවලට ඇතුළත් ය. මෙම අරමුදලේ පරමාර්ථය සහ අදාළ විස්තර ගිණුම්වල අංක 17.1 සහ 18 දරණ සටහන්වල දැක්වේ.

**ගිවිසුම්වලදී අධ්‍යක්ෂවරුන්ගේ අභිමතය**

ගිණුම්වල 27.3 සටහනින් පෙන්වා දී ඇති පරිදි සමාගමේ අධ්‍යක්ෂවරුන් සමාගමේ කොන්ත්‍රාත් කටයුතුවලදී සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වී නොමැත.

**ආයතනික පාලනය**

සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් ආයතනික යහ පාලනය සහතික කරනු ලැබේ. සමාගමේ අරමුණු මෙන්ම කොටස්කරුවන්ගේ බලාපොරොත්තු සමග අනුකූලවන පැවැත්ම සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**බදුකරණය**

පොලී ආදායමින් ඇතිවන ආදායම් බදු බැඳියාව ගිණුම්වල සටහන් අංක 23 යටතේ පෙන්වා දී ඇත. මෙහෙයුම් කටයුතුවල ලාභය 2006 වර්ෂයේ අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 16 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇත.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවීමට ඇති සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට නිවැරදිව ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරුන්ගේ දැනුම සහ විශ්වාසය අනුව සෑහීමකට පත්වේ.

**අනුකූලතාවය**

සමාගම ශ්‍රී ලංකාවේ හෝ වෙනත් දේශයකට අදාළ වන නීති සහ රෙගුලාසිවලට පටහැනි වන කිසිදු කාර්යයක නිරත වී නොමැත.

**ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්**

**අඛණ්ඩ පැවැත්ම**

ඉදිරියට දැකිය හැකි කාලය තුළ සමාගමට, එහි මෙහෙයුම් කටයතු අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත්වේ. මෙම අරමුණ මත පිහිටා සමාගමේ ගිණුම් සකස් කිරීමේ දී අප අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය යොදාගනිමු.

**විගණකවරුන් පත්කිරීම**

2012.03.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා සමාගමේ ගිණුම් විගණනය කිරීමට වරලත් ගණකාධිකාරීවරුන් වන M/S BDO Partners ආයතනය විගණකාධිපති විසින් නම් කරන ලද අතර, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලදී. විගණනවරුන්ගේ විධිමත් පත්වීම කොටස් කරුවන්ගේ වාර්ෂික රැස්වීමේ දී සිදුකරන ලදී.
අධ්‍යක්ෂවරුන් දැනුවත් වී ඇති පරිදි විගණකවරුන්ට සමාගම සමග හෝ ඔවුන්ගේ නිදහසට බලපෑමක් කළ හැකි එහි උප සමාගම් සමග කිසිදු සම්බන්ධතාවයක් නොමැත.

මණ්ඩලයේ අණ පරිදි

අත්සන් කළේ

ෆිනෑන්සියල් සර්විසස් හා කොමර්ෂල් එජන්සීස් (පුද්ගලික) සමාගම
(වග/555/91)
අංක 28, රොස්මීඩ් පෙදෙස,
කොළඹ 07.

"මසකට වරක්" යන පදනම මත සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රැස්වීම් පවත්වා ඇත. මූල්‍ය පාලනය සහ පවත්වා ගැනීම සහතික කිරීමෙහි ලා සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික අයවැය මුඛ්‍ය මෙවලම් විය. එම සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික අයවැය, මුදල් වර්ෂය ආරම්භයේ දී සියළු රේඛීය කළමනාකරුවන් සමග සාකච්ඡා කොට සකස් කරන ලදුව මණ්ඩලය විසින් අනුමත කර ඇත.

ඉකුත් මස හා සැසඳීමක් සමග මාසික කාර්යසාධන වාර්තාව සහ අයවැය මාසික රැස්වීමේ දී නිතිපතා සභාගත කර ඇත. මෙම වාර්තා, ඉලක්ක සමග, මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය ගැන කාලීන තොරතුරු සපයන අතර, සමාගමේ ලාභ සහ පාඩු අනුව ඵලදායි කළමනාකරණ තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට පිහිට වේ.

## විගණන කමිටුව

විගණක කමිටුවෙහි මුලසුන දැරිය යුත්තේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා ය. මිල්කෝ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු නොමැති බැවින්, විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනා විගණක කමිටුවේ සාමාජිකයන් හැටියට සේවය කළ හ. කමිටුවට අභ්‍යන්තර විගණකගේ සහාය ලැබුණි. අභ්‍යන්තර විගණක සේවය, වැඩි ස්වාධීනත්වයක් සහතික කිරීම සඳහා බාහිර වශයෙන් ලබා ගැනීමට කටයුතු කර ඇත.

වර්ෂය තුළ අභ්‍යන්තර විගණකයන් හැටියට M/S SJMS Associates සේවය කළේ ය. එම සේවය ප්‍රධාන කාර්යාලයට අමතරව කොළඹ, අඹේවෙල සහ දිගන කම්හල්වල නේවාසික නිලධාරීන් සහිත ශාඛා කාර්යාල මගින් ක්‍රියාත්මක වේ.

අභ්‍යන්තර විගණකවරුන් විසින් සකස් කරනු ලබන විගණන සැලැස්මක් වර්ෂය ආරම්භයේ දී අනුමැතිය සඳහා විගණන කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ. මෙම සැලැස්මට අනුව වසර තුළ අභ්‍යන්තර විගණන පිරික්සුම් සිදු කරනු ලැබේ. විගණනයෙන් සොයාගත් කරුණු පිළිබඳ විස්තරාත්මක වාර්තා ප්‍රථමයෙන් අදාළ කළමනාකරුවන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමග සාකච්ඡා කොට, ඔවුන්ගේ අදහස් සහ ප්‍රතිචාර පදනම් කොට ගෙන සාරාංශ වාර්තාවක් සකසා විගණක කමිටුවේ සමාලෝචනය සහ අනුගාමී කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලැබේ. විගණන කමිටුව මසකට වරක් රැස් වේ.

## ආයතනික කළමනාකරණය

තම කොටස්කරුවන්ට සාධාරණ නිරවද්‍යතාවයකින් යුක්තව සමාගමේ මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි සමාගමේ මූල්‍ය වාර්තා තබාගන්නා බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වෙයි. තව ද, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කොට ඉදිරිපත් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වෙයි.

විගණක කමිටුව සාමාන්‍යයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරු තුන් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන් එක් අයෙක් මහාභාණ්ඩාගාරයේ නියෝජිතයා වියයුතු අතර කමිටුවේ සභාපතිවරයා වීමද අනිවාර්යය වේ. සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි මහා භාණ්ඩාගාර නියෝජිතයෙකු නොමැති බැවින්, පහත අත්සන් තබන මා සභාපති හැටියට කටයුතු කරන තවත් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සාමාජිකයන් හැටියට සේවය කරන කමිටුවක්, විගණක කමිටුව හැටියට සේවය කරයි.

සමාලෝචන වසර තුළ නිතිපතා රැස්වීම් පවත්වන ලදී. මූල්‍ය පාලක ද, සහකාර කළමනාකරුවන් (මූල්‍ය) දෙදෙනෙකු ද, අභ්‍යන්තර විගණක කළමනාකරු ද ආරාධිතයන් හැටියට රැස්වීම්වලට සහභාගි වූහ. කර්මාන්තශාලාවල ප්‍රධානීන්ට ද, සමාගමේ අංශ ප්‍රධානීන්ට ද, රැස්වීම්වලට සහභාගි වීමට ආරාධනා කරන ලදී.

වසර තුළ පැවැත් වූ මාසික රැස්වීම්වල දී, අභ්‍යන්තර විගණක විමසුම් සහ මාසික විගණක වාර්තා සමාලෝචනය කළ විගණක කමිටුව, කම්හල් ප්‍රධානීන් සහ වෙනත් ක්‍රියාකාරී ප්‍රධානීන් විසින් විගණක වාර්තාවල අවධානයට ලක්කර ඇති කරුණු ගැන සිදුකර ඇති පැහැදිලි කිරීම් සහ විවරණයන් පිරික්සා, අභ්‍යන්තර විගණක වාර්තාවල දක්වා ඇති අඩුලුහුඩුකම් සහ වැරදි නිවැරදි කොට අනාගතයේ දී නැවත සිදු නොවන බව සහතික කරන ලෙස නිලධාරීන්ට අවවාද කර ඇත. තව ද, අභ්‍යන්තර විගණක විමසුම්වලට පිළිතුරු එවීම ඉක්මන් කරන ලෙස කාර්යමණ්ඩලයට විගණක කමිටුව විසින් අවවාද කරන ලදී.

විගණක කමිටුව, අභ්‍යන්තර විගණක වාර්තා අධ්‍යයන කිරීමෙන් සහ අභ්‍යන්තර විගණක කාර්ය මණ්ඩලය සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළේ ය.

විගණක කමිටුව, බාහිර විගණකවරුන් ඉදිරිපත් කළ කළමනාකරණ වාර්තාව සමාලෝචනය කොට, සභාපති, නියෝජ්‍ය සභාපති සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂට එම කළමනාකරණ වාර්තාවේ සෑම අංශයක් ම විස්තරාත්මකව අධ්‍යයනය කොට, සමාගමේ තත්ත්වය දියුණු කිරීමේ අරමුණ ඇතිව, ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් යෝග්‍ය පියවර ගන්නා ලෙස උපදෙස් දුන්නේ ය.

එස් ලෝගනාදන්,
වැඩබලන සභාපති, විගණක කමිටුව
සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගම

# අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට දකුණට
ඩබ්.ජී.ආර්.එච්. පණ්ඩිතරත්න මහතා - අධ්‍යක්ෂ,  ආචාර්ය අජිත් දිසානායක මහතා - අධ්‍යක්ෂ,
තිලංක වීරසිංහ මහතා - අධ්‍යක්ෂ, නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්, දිවුරුම් කොමසාරිස්,
කේ. සංජය ලීලාරත්න මහතා - නියෝජ්‍ය සභාපති,  සුනිල් වික්‍රමසිංහ මහතා - සභාපති,
එම්. නෞවුෂාඩ් ජුනයිඩීන් මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ,  සෙල්වදුරෙයි ලෝගනාදන් මහතා FCMA (UK), FSCMA (ශ්‍රී ලංකා) - අධ්‍යක්ෂ,
දශිකා එඩ්වර්ඩ්ස් මහත්මිය - අධ්‍යක්ෂ,  රාජු සිවරාමන් මහතා M.Sc. (රජය), FIA (ශ්‍රී ලංකා) - අධ්‍යක්ෂ - නොපැමිණි

### මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව

2012 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය ද, එදින අවසන් වූ වසර සඳහා ආදායම් ප්‍රකාශය ද, හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය ද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ද, පිටු අංක 05 සිට 25 දක්වා පළවන සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය ඇතුළු වෙනත් පැහැදිලි කිරීමේ සටහන් ද, ඇතුළත් වූ අමුණා ඇති සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගමේ මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

### මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කළමනාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සාධාරණ ලෙස සකස් කළ මූල්‍ය ප්‍රකාශ සම්පාදනය සහ ඉදිරිපත් කිරීම කළමනාකාරිත්වයේ වගකීමකි. මෙම වගකීමට ඇතුළත් කරුණු මෙසේ ය: වංචාව හෝ වැරදීමක් මගින් සිදුවන ප්‍රමාණාත්මතා අවප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශ සම්පාදනය සහ සාධාරණ ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගැනීම; යෝග්‍ය ගිණුම් ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීම; පවත්නා තත්ත්වය යටතේ සාධාරණ වන්නා වූ ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

### විගණනයේ විෂය පථය සහ මතය සඳහා පදනම

විගණනය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශ ගැන මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීමකි. ඡේද (අ), (ඉ) සහ (ඊ)වල කරුණු ඉදිරිපත් කර ඇති පරිදි හැර, සෙසු කොටස් සම්බන්ධයෙන් අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිති අනුව සිදුකර ඇත. මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන කරුණ ගැන සාධාරණ සහතික වීමක් ලැබෙන අයුරින් විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම ගිණුම් ප්‍රමිතිවලින් අපේක්ෂිත ය.

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන දිනයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම විගණනයට ඇතුළත් ය. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීම ද විගණනයට ඇතුළත් ය.

අපගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි (අ), (ඉ), (ඊ) ඡේද හැර සෙසු කොටස් සම්බන්ධයෙන් විගණන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් අපට ලැබී ඇත. එබැවින් අපගේ කොන්දේසි සහිත වූ මතය සඳහා සාධාරණ පදනමක් අපගේ විගණනයෙන් ලැබී ඇති බව විශ්වාස කරමු.

### මතය

(අ) දේපළ පිරියත සහ උපකරණ

ශේෂ පත්‍ර දිනයට හිඟව තිබෙන තැන්පතු බැරකම වන රු. 35,335,028/- ට අනුරූප වන, ඉකුත් වසරෙන් ඉදිරියට ගෙන ආ බෝතල් සහ ඇහුරුම් පෙට්ටිවල අගය වන රු. 213,454,027/- සත්‍යායනය සඳහා යෝග්‍ය ලේඛනගත සහ වෙනත් සනාථකරණ සාක්ෂි අපට ලැබී නැත. සමාගමේ වාර්තා සහ ක්‍රියාත්මක වෙනත් විගණන ක්‍රියාමාර්ගවල ස්වභාවය මත එබඳු වත්කම්වල ඇගයීම සහ පැවැත්ම සහ ශේෂ පත්‍ර දිනට අනුරූප බැරකම ගැන අපට සෑහීමට පත්වීමට නොහැකි විය.

(ආ) භාණ්ඩ ලේඛනය

නිමි භාණ්ඩ / අමුද්‍රව්‍ය සහ පාරිභෝජ්‍ය භාණ්ඩ

නිමි භාණ්ඩ, අමුද්‍රව්‍ය සහ පාරිභෝජ්‍ය භාණ්ඩවල අගය පිළිවෙළින් රු. 125,391,410/-, රු. 145,632,097/- සහ රු. 203,408,433/- හැටියට දක්වා ඇත. මේවා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව ඇගයීමට භාජන කර නැත. සමාගමේ වාර්තාවල ස්වභාවය අනුව, භාණ්ඩ ලේඛනය මත එම ගැලපීමෙහි බලපෑම අපට නිර්ණය කළ නොහැක.

(ඈ) වෙළෙඳාම සහ වෙනත් ලැබිය යුතු දෑ

ලැබීම සැක සහිත වුව ද, දීර්ඝ කාලීනව හිඟව ඇති රු. 23,757,824/-ක අගයක් ඇති පූර්ව ගෙවීම් සම්බන්ධයෙන්, බොල් ණය හා අඩමාන ණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලස්වා නැත.

සමාගමේ වාර්තාවල ස්වභාවය සහ වෙනත් ක්‍රියාත්මක විගණන ක්‍රියාමාර්ග හේතු කොට ගෙන ශේෂ පත්‍ර දිනට එබඳු ලැබිය යුතු ශේෂවල ඇගැයීම සහ පැවැත්ම ගැන අපට සෑහීමට පත්විය නොහැකි විය.

(ඈ) විලම්භිත බදු වත්කම් / බැරකම්

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අනුව ශේෂ පත්‍ර දිනට විලම්භිත බදු වත්කම් / බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලස්වා නැත.

(ඉ) පොලී සහිත ණය දීම සහ ණය ගැනීම / පොලී රහිත ණය දීම සහ ණය ගැනීම

කෘෂිකර්ම සහ පශුසම්පත් සංවර්ධන අමාත්‍යාංශයට ගෙවිය යුතු රු. 83,590,654/-ක් වන ශේෂයෙහි නිරවද්‍යතාවය සහ පැවැත්ම ස්වාධීනව සත්‍යායනය සඳහා සෘජු සනාථ කිරීම වැනි සතුටුදායක සාක්ෂි අපට ලැබී නැත.

සමාගමේ වාර්තාවල ස්වභාවය නිසා ද, අන්‍ය විගණන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් ද, ශේෂ පත්‍ර දිනට එබඳු ගෙවිය යුතු දෑවල පැවැත්ම සහ සම්පූර්ණත්වය ගැන අපට සෑහීමට පත්විය නොහැකි විය.

(ඊ) වෙළෙඳාම සහ වෙනත් ගෙවිය යුතු දෑ

සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 20,446,164/- ක් වන ශේෂයෙහි පැවැත්ම සහ නිරවද්‍යතාවය ස්වාධීනව සත්‍යායනය සඳහා සෘජු සනාථ කිරීම වැනි සතුටුදායක සාක්ෂි අපට ලැබී නැත.

සමාගමේ වාර්තාවල ස්වභාවය සහ විගණන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් ශේෂ පත්‍ර දිනට එබඳු බැරකම්වල පැවැත්ම සම්පූර්ණත්වය ගැන අපට සෑහීමට පත්විය නොහැක.

අපගේ පරීක්ෂණවලින් පෙනියන පරිදි, (අ), (ඉ), (ඊ) ඡේදවලින් පෙන්වා දී ඇති කරුණු ගැන අපට සෑහීමට පත්වීම සඳහා අවශ්‍ය විය හැකි ගැලපීම්වල බලපෑම හැරුණ විට සහ ඡේද (ආ), (ඇ), (ඈ)වලින් දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශවලට වන බලපෑම හැර, සමාගම 2012 මාර්තු 31න් අවසන් වන වර්ෂය සඳහා විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ගෙන ඇති බවත්, 2012 මාර්තු 31 දිනට සමාගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදින අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව සමාගමේ පාඩුව සහ මුදල් ප්‍රවාහය ගැන සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බවත්, අපගේ මතය වේ.

**කරුණු අවධාරණය කිරීම**

තවදුරටත් අපගේ මතය සීමා නොකර, මූල්‍ය ප්‍රකාශවල 13.5 සහ 22 සටහන් වෙත අවධානය යොමු කරමු.

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 වර්ෂයේ අංක 07 දරණ සමාගම් පනතේ අංක 151(2) වගන්තිය අනුව පනවා ඇති අවශ්‍යතාවලට මෙම මූල්‍ය ප්‍රකාශ අනුකූල වේ.

BDO Partners

වරලත් ගණකාධිකාරින්,
කොළඹ
2012 නොවැම්බර් 28
SSR/cc

# මිල්කෝ (පුද්ගලික) සමාගම 2012 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| | සටහන | 2011 / 2012 රු. | 2010 / 2011 රු. |
|---|---|---|---|
| ආදායම | 3 | 5,263,152,211 | 4,548,974,053 |
| විකුණුම් පිරිවැය | | (5,013,827,195) | (4,012,024,624) |
| දළ ලාභය | | 249,325,016 | 536,949,429 |
| අනෙකුත් ආදායම් | 4 | 167,245,922 | 100,440,617 |
| | | 416,570,938 | 637,390,046 |
| පරිපාලන වියදම් | | (500,006,174) | (413,113,697) |
| බෙදාහැරීමේ වියදම් | | (73,073,775) | (66,130,740) |
| අනෙකුත් වියදම් | | (23,205,858) | (31,977,865) |
| මූල්‍ය පිරිවැය | 5 | (35,805,724) | (15,504,264) |
| | | (632,091,530) | (526,726,566) |
| බද්දට පෙර (අලාභය) ලාභය | 6 | (215,520,592) | 110,663,480 |
| ආදායම් බදු වියදම් | 7 | (10,917,993) | (27,471,930) |
| වර්ෂය සඳහා වන ලාභය / අලාභය | | (226,438,585) | 83,191,550 |
| කොටසක මූලික ඉපයුම් / කොටසක (අලාභය) | 8 | (7.09) | 2.60 |

වරහන් තුළ සංඛ්‍යා අඩු කිරීම් වේ.

05 පිටුවේ සිට 25 පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනුකූල කොටසක් වේ.

2012 නොවැම්බර් 28 දින
කොළඹ

| | සටහන | 2011 / 2012 දිනට රු. | 2010 / 2011 දිනට රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 09 | 831,623,199 | 532,747,937 |
| ප්‍රාග්ධන වැඩ (දැනට සිදුවේ) | 10 | 497,637,177 | 19,366,961 |
| දීර්ඝ කාලීන ආයෝජන | 14 | 839,160,352 | |
| | | 2,168,420,728 | 552,114,898 |
| **ජංගම වත්කම්** | | | |
| පශු සම්පත් | 11 | 305,900 | 1,431,645 |
| තොගය | 12 | 483,296,739 | 347,851,960 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් | 13 | 1,123,463,869 | 895,480,728 |
| කෙටි කාලීන ආයෝජන | 14 | 175,100,000 | 930,623,649 |
| මුදල් හා ඒ සමාන දේවල් | 15 | 33,007,766 | 394,346,782 |
| | | 1,815,174,273 | 2,569,734,764 |
| **මුළු වත්කම්** | | 3,983,595,001 | 3,121,849,662 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 16 | 319,454,060 | 319,454,060 |
| ප්‍රාග්ධන සංචිත | 17 | 25,000,000 | 25,000,000 |
| ප්‍රති ඇගයුම් සංචිත | | 336,454,462 | 336,454,462 |
| නිදන් අරමුදල | 18 | 1,689,978 | 1,689,978 |
| රඳවාගත් සංචිත | | 964,840,393 | 1,191,278,978 |
| කොටස් කරුවන්ගේ අරමුදල | | 1,647,438,893 | 1,873,877,478 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පොලී රහිත ණය සහ ණයට ගැනුම් | 19 | 85,698,717 | 85,698,717 |
| පොලී සහිත ණය - දීර්ඝ කාලීන | 19 | 642,228,098 | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂික | 20 | 338,682,103 | 201,703,631 |
| විලම්භිත ආදායම - රජයේ ප්‍රදාන | 21 | 15,497,684 | 20,757,825 |
| | | 1,082,106,602 | 308,160,173 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ | 22 | 862,317,139 | 823,121,208 |
| ආදායම් බදු වගකීම | 23 | 19,455,329 | 27,758,202 |
| පොලී සහිත ණයට ගැනීම් - කෙටි කාලීන ණය | 19 | 86,668,946 | 423,240 |
| බැංකු අයිරා | 24 | 285,608,091 | 88,509,361 |
| | | 1,254,049,506 | 939,812,011 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 3,983,595,001 | 3,121,849,662 |

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් වේ.

බැඳීම් සහ අසම්භාව්‍යයන් 25 & 26

17 පිටුවේ සිට 50 පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

..............................................
සී මුඩුගල්ලේ
මූල්‍ය පාලක

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරමි.

..............................................
සභාපති
එස්.සී.එස්. වික්‍රමසිංහ

..............................................
අධ්‍යක්ෂ
එස්. ලෝගනාදන්

2012 නොවැම්බර් 28 දින
කොළඹ

# මිල්කෝ (පුද්ගලික) සමාගම 2012 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| | ප්‍රකාශිත ප්‍රාග්ධන රු. | ප්‍රාග්ධන සංචිත රු. | ප්‍රති ඇගයුම් සංචිත රු. | නිදන් අරමුදල රු. | රඳවාගත් ඉපැයුම් රු. | මුළු එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 2010.03.31 දිනට ශේෂය | 319,454,060 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 1,108,087,428 | 1,790,685,928 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | - | 83,191,550 | 83,191,550 |
| 2011.03.31 දිනට ශේෂය | 319,454,060 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 1,191,278,978 | 1,873,877,478 |
| වර්ෂය සඳහා ශුද්ධ අලාභය | - | - | - | - | (226,438,585) | (226,438,585) |
| 2012.03.31 දිනට ශේෂය | 319,454,060 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 964,840,393 | 1,647,438,893 |

වරහන් තුළ සංඛ්‍යා අඩු කිරීම් වේ.

පිටු අංක 05 සිට 25 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය අංගයන් වේ.

කොළඹ
2012 නොවැම්බර් 28

## මිල්කෝ (පුද්ගලික) සමාගම
## 2012 මාර්තු 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011/2012 | 2010/2011 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| බද්දට පෙර ශුද්ධ (අලාභය) / ලාභය | (215,520,592) | 110,663,480 |
| ගැලපුම්, | | |
| - දේපළ පිරියත හා උපකරණ මත ක්ෂය කිරීම | 123,306,838 | 158,638,553 |
| - ආයෝජන ආදායම් | (83,767,183) | (88,453,539) |
| - පොලී වියදම් | 29,484,038 | 964,195 |
| - විලම්භිත දීමනා මත හඳුනාගත් ආදායම | (400,600) | (9,669,546) |
| - තොග කපා හැරීම | - | 260,681 |
| - අලාභය සහ සාධාරණ අගය සඳහා පශු සම්පත් ගැලපීම | 15,835 | |
| - නොලැබුණ හුවමාරු ලාභය | (75,077,781) | 15,171,011 |
| - බොල් සහ අඩමාන ණය සඳහා ගැලපීම | 1,164,172 | |
| - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා වෙන් කිරීම පාරිතෝෂික | 140,373,568 | 85,457,151 |
| | 135,098,887 | 162,368,505 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | (80,421,704) | 273,031,985 |
| තොග - (වැඩිවීම) / අඩුවීම | (135,444,779) | 179,093,535 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම්වල (වැඩිවීම) / අඩුවීම | (199,163,892) | (108,902,258) |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම / (අඩුවීම) | 39,195,931 | 13,745,411 |
| | (295,412,739) | 83,936,688 |
| **මෙහෙයුම් තුළින් උත්පාදනය කළ මුදල්** | (375,834,444) | 356,968,674 |
| ගෙවූ පොලී | (29,478,528) | - |
| ගෙවූ ආදායම් බදු | (22,712,603) | (42,533,303) |
| ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික | (3,395,096) | (8,851,220) |
| | (55,586,227) | (51,384,523) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු/භාවිතා වූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | (431,420,671) | 305,584,151 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද මූල්‍ය ප්‍රවාහය** | | |
| දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | (35,228,612) | (112,835,181) |
| ඉදිකිරීම් හේතුකොට ගෙන දේපළ, පිරියත හා උපකරණ | (761,477,220) | (26,831,253) |
| පශු සම්පත් විකිණීමෙන් ලද ආදායම | 1,109,910 | - |
| ලද පොලී | 44,321,466 | 85,078,392 |
| ආපසු ගත් / (නව) කෙටි කාලීන සහ දීර්ඝ කාලීන ආයෝජන | (8,558,922) | (223,197,127) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද (භාවිතා කළ) ශුද්ධ මුදල් | (759,833,378) | (277,785,169) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද මූල්‍ය ප්‍රවාහය** | | |
| රජයෙන් ලද දීමනා | 8,094,492 | 7,860,285 |
| ගෙවූ කල්බදු කුලිය | (428,749) | |
| ණය සහ ණයට ගැනීම්වලින් ආදායම (ශුද්ධ ආපසු ගෙවීම) | 625,150,559 | (5,144,988) |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල | 632,816,302 | 2,715,297 |
| මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම | (558,437,747) | 30,514,279 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදලට සමාන දේ | 305,837,421 | 281,793,973 |
| වර්ෂය අවසනායේ දී මුදල් හා මුදලට සමාන දේ | (252,600,325) | 305,837,421 |
| වර්ෂය ආරම්භයේ දී | | **සටහන ඒ** |
| බැංකුවල ඉතිරි ශේෂය | 393,001,398 | 367,468,275 |
| අත ඇති මුදල් | 1,345,384 | 556,670 |
| | 394,346,782 | 368,024,945 |
| බැංකු අයිරා | (88,509,361) | (86,230,973) |
| | 305,837,421 | 281,793,972 |
| වර්ෂය අවසානයේ දී | | **සටහන බී** |
| බැංකුවල ඉතිරි ශේෂය | 29,892,575 | 393,001,398 |
| අත ඇති මුදල් | 3,115,191 | 1,345,384 |
| | 33,007,766 | 394,346,782 |
| බැංකු අයිරා | (285,608,091) | (88,509,361) |
| | (252,600,325) | 305,837,421 |

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් වේ.
05 පිටුවේ සිට 25 පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනුකූල කොටසක් වේ.
2012 නොවැම්බර් 28 දින කොළඹ

## 1. ආයතනික තොරතුරු

### 1.1 පොදු

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම යනු ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන සංස්ථාපිත සීමාසහිත වගකීම දරණ සමාගමකි.

"සීමාසහිත ලංකා කිරියා කිරි කර්මාන්ත (පුද්.) සමාගම" ලෙස 1996 මැයි 09 වන දින සමාගම සංස්ථාගත කර ඇත. සමාගමේ නම සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගම ලෙස 2001 ජුලි 23 වන දින සිට වෙනස් කර ඇත. ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු ජාතික කිරි සංවර්ධන මණ්ඩලය අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව, සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගමට අයත් වූ එය 1998 පෙබරවාරි 03 වන දින වන විට භාවිතා කළ සියලු දේපළ, පිරියත හා උපකරණවල (ඉඩම් හැර) අයිතිය සහ සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන (පුද්.) සමාගම විසින් එම දිනය වන විට භාවිතා කළ ඉඩම් හා ගොඩනැගිලිවල බදු අයිතිය 1998 පෙබරවාරි 04 වන දින සිට සමාගම වෙත මාරු කර තිබේ. එසේ මාරු කරන ලද වත්කම්වල ශුද්ධ වටිනාකම රු. 306,500,020/-කි. තව ද 2000 අගෝස්තු 08 දිනැති ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණ කොමිසමෙහි ලිපියට අනුව බදුගත් ඉඩම හා ගොඩනැගිලිවල වාර්ෂික කල්බදු කුලිය වන රු. 20,427,900/- මුදල, ඒකාබද්ධ ව්‍යාපාරය බවට පත් කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කපා හැර ඇත. ඒකාබද්ධ ගිවිසුම තවදුරටත් බලාත්මක නොවුව ද එකී රජයේ ඉඩම හා ගොඩනැගිලිවලට අදාළ ගිණුම් යථා පරිදි ගැලපීමට සමාගම පියවර ගෙන නැත.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 45, නාවල පාර, කොළඹ 05 යන ස්ථානයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික කටයුතු ද එම ස්ථානයේ සිදු කරනු ලබයි. සමාගමේ ප්‍රධාන කර්මාන්තශාලා නාරාහේන්පිට, අඹේවෙල, දිගන හා පොලොන්නරුව යන ස්ථානවල පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

වර්ෂය තුළ දී සමාගම විසින් සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ කිරි එකතු කිරීම, පිරිසැකසුම, ඇසිරීම, බෙදාහැරීම හා එම නිෂ්පාදන අලෙවි කිරීමයි.

## 2. ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

### 2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1.1 සැකසීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ප්‍රමිතීන් හා පොදුවේ පිළිගත් ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්ප්‍රදායන් යටතේ උපචිත පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මුදල්වලින් ඉදිරිපත් කර ඇත.

#### 2.1.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

2007 වර්ෂයේ අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන් හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි 2012 මාර්තු 31 වන දින වන විට හා සහ එදින අවසාන වූ වසර සඳහා සමාගමේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, හිමිකම් හා මූල්‍ය ප්‍රවාහ වෙනස්වීම් සමග ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් ("මූල්‍ය ප්‍රකාශන") සකස් කරනු ලැබ ඇත.

#### 2.1.3 සංසන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව යොදා ගෙන ඇති අතර, එම ප්‍රතිපත්ති ඉකුත් වසරේ ප්‍රතිපත්තිවලට අනුරූප ය. අවශ්‍ය තන්හි ඉකුත් වසරේ ඉලක්කම් සහ පාඨ වත්මන් වසරේ ඉදිරිපත් කිරීමට ගැලපෙන පරිදි යලි සකසා ඇත.

2.2 **වත්කම් හා එම වත්කම් තක්සේරු කිරීමේ පදනම**

2.2.1 **දේපළ, පිරියත හා උපකරණ**

ආ) පිරිවැය

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය කිරීම් සහ අගය අඩු කිරීම් අඩුකර දක්වා ඇත.

ආ) පිරිවැය හා ඇගයීම

සියළුම දේපළ, පිරියත සහ උපකරණ ආරම්භයේ දී පිරිවැයට ගිණුම්ගත කර ඇත. එහෙත් යම් යම් වත්කම්, පිරියත හා උපකරණ පසුව නැවත ප්‍රත්‍යාගණනයක් කරනු ලබන අවස්ථාවක දී එවැනි සියළු වත්කම් පංති ප්‍රත්‍යාගණනයකට භාජනය කරනු ලැබේ.

ඇ) ක්ෂය කිරීම්

ක්ෂය කිරීම් සඳහා වූ වෙන්කිරීම් සිදු කරනු ලබන්නේ එවැනි වත්කම්වල ඇස්තමේන්තු ජීවිත කාලය මුළුල්ලේ කපා හැරිය හැකි වන පරිදි සරල මාර්ගික ක්‍රමය භාවිතා කරමින් ඒවායේ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මතයි.

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති වත්කම් ක්ෂය කිරීම් කරනු ලබන්නේ කල්බදු කාල සීමාව හෝ එහි ඇස්තමේන්තු ජීවිත කාලය යන කාල දෙකෙන් අඩු කාලය මත ය.

මේ සඳහා භාවිතා කළ ප්‍රධාන වාර්ෂික අනුපාත පහත දැක්වේ. මෙම අනුපාත ඉකුත් වසරවල අනුපාතවලට අනුකූල ය.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 06 සිට 10 දක්වා |
| ලී බඩු හා සවිකිරීම් | වසර 03 සිට 05 දක්වා |
| විද්‍යාගාර උපකරණ | වසර 03 සිට 05 දක්වා |
| රථවාහන | වසර 02 සිට 04 දක්වා |
| මෙවලම් හා උපකරණ | වසර 03 සිට 10 දක්වා |
| කාර්යාලීය උපකරණ | වසර 2.5 සිට 05 දක්වා |
| බෝතල් හා ඇසුරුම් භාජන | වසර 04 |
| පරිගණක | වසර 02 සිට 04 දක්වා |
| බෝතල් සිසිල්කරණ | වසර 2.5 සිට 04 දක්වා |
| මෘදුකාංග | වසර 03 |
| කිරි භාජන | වසර 05 |

වත්කම් ක්ෂය කිරීම එය භාවිතාවට ගන්නා අවස්ථාවේදී ම ආරම්භ වන අතර, වත්කම විකිණීම සඳහා තැබීමට වර්ගීකරණය කරනු ලබන දින සිට සහ වත්කම් භාවිතාවට නොගන්නා දින සිට යන දෙකෙන් කලින් එළඹුන දින ක්ෂය කිරීම අවසන් වේ.

වත්කමේ සුන්බුන් වටිනාකම, ප්‍රයෝජනවත් කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමය සෑම මූල්‍ය වර්ෂයකදී ම අවශ්‍ය නම් සමාලෝචනය හා ගැලපීම කරනු ලැබේ.

ඈ) ප්‍රතිසංස්කරණ පිරිවැය

දේපළ, පිරයත සහ උපකරණවලින් ආරම්භයේ දී අපේක්ෂිත ඇස්තමේන්තුගත කාර්යසාධනය අනාගතයේ දී පවත්වා ගැනීම සඳහා සිදු කරන ප්‍රතිසංස්කරණ සඳහා යන වියදම, එම වියදම දරන අවස්ථාවේදී ම වියදමක් හැටියට ගිණුම්ගත කරනු ලැබේ.

ඉ) භාවිතා කළ නොහැකි සේ හඳුනා ගැනීම

වත්කම්, පිරියත සහ උපකරණවලින් යම් අයිතමයක් ඉවත් කිරීම හෝ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි විට භාවිතා කළ නොහැකි සේ හඳුනා ගනු ලැබේ. වත්කමක් භාවිතා කළ නොහැකි සේ හඳුනා ගැනීම මත ඇතිවන යම් ලාභ හෝ අලාභ, බැහැර කිරීමේ ශුද්ධ ලැබීම් සහ ඉදිරියට ගෙනා ප්‍රමාණය අතර වෙනස වශයෙන් ගණනය කරනු ලැබේ.

### 2.2.2 කල්බදු

අ) මූල්‍ය කල්බදු - සමාගම බදු ගැණුම්කරු වන අවස්ථාවන් හි දී

හිමිකාරත්වය ලැබීමත් සමග, හිමි වූ දැයට සම්බන්ධ අවදානම සහ ප්‍රතිලාභ කල්බදු ලබාගත් අයට හිමිවන කල්බදු, මූල්‍ය කල්බදු ලෙස වර්ග කරනු ලැබේ. සමුච්චිත ක්ෂය වීම සහ සමුච්චිත හාරිකරණ පාඩු අඩු කොට, සාධාරණ අගය හෝ අවම කල්බදු ගෙවීම යන ප්‍රමාණ දෙකෙන් අඩු ප්‍රමාණයට සමාන සේ සලකා මූල්‍ය කල්බදු ගැනීම් ගණනය කරනු ලැබේ.

බදු හිමියාට ගෙවිය යුතු වන අනුරූප මූලික ප්‍රමාණය බැරකමක් ලෙස පෙන්නුම් කෙරේ. අනාගත කාලයන් සඳහා වෙන්කරන ලද මූල්‍ය ගාස්තු සටහන්වල වෙන් වෙන්ව පෙන්වා ඇත.

එක් එක් මුදල් වර්ෂයට අදාළ වන කලින් පැවති බැඳියාවේ පොලියට එක් එක් කාලය වෙනුවෙන් පවත්නා බැර ශේෂය මත ස්ථාවර කාලවර්තන පොලි අනුපාතයන් ඇති කිරීමට, බදු කාලය මුළුල්ලේම ආදායම් ප්‍රකාශනයෙන් අයකර ගනු ලැබේ.

කල්බදු දේපළ හෝ එහි වැඩි දියුණු කිරීමට අදාළ පිරිවැය ප්‍රාග්ධනිකරණය කරනු ලබන අතර, කල්බද්ද සම්පූර්ණ නොවූ කාලය හෝ වැඩි දියුණු කිරීමෙන් තක්සේරු කළ ප්‍රයෝජන ගත හැකි ආයු කාලය යන දෙකෙන් අඩු කාලය තුළ ක්ෂය කරනු ලැබේ.

මූල්‍ය කල්බද්දකින් ඇතිවන විකිණීමක් හෝ කල්බදු ගනුදෙනුවක් සම්බන්ධ වත්කමක ඉදිරියට ගෙනා වටිනාකමට වැඩි යම් විකුණුම් අතිරික්තයක් වේ නම් බදු කාලය පුරා විලම්භනය කර හිලව් කරනු ලැබේ.

ආ) මෙහෙයුම් කල්බදු

කල්බදු කාලය යටතේ වත්කමක සියළු අවදානම් සහ ප්‍රතිලාභ කල්බදු හිමිකරු ඵලදායිව දරනු ලබන කල්බදු, මෙහෙයුම් කල්බදු වශයෙන් වර්ගීකරණය කරන ලදී.

මෙහෙයුම් කල්බදු යටතේ ගෙවනු ලබන කල්බදු ගෙවීම් (රක්ෂණ සහ නඩත්තු වැනි සේවා පිරිවැය හැර) සරල මාර්ගික පදනමක් මත කල්බදු කාලය පුරා ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස පෙන්වා ඇත.

### 2.2.3 වත්කම් හාරිකරණය

සෑම වාර්තාකරන දිනයකදී ම, කිසියම් වත්කමක් හාරිකරණය වීමට ඇඟවීමක් තිබේ ද යන්න සමාගම විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. එබඳු ඇඟයීමක් ඇත්නම් හෝ කිසියම් වත්කමක් වාර්ෂිකව හාරිකරණ ඇස්තමේන්තු කිරීම අවශ්‍ය නම්, සමාගම එම වත්කමෙන් පිළි ලබාගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරයි. වත්කමක පිළි ලබාගත හැකි ප්‍රමාණය වන්නේ වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩවලින් බෙහෙවින් පරිභාහිරව, එම වත්කම මුදල් ගලා ඒමක් සිදු නොකරන්නේ නම්, අදාළ වත්කමෙහි හෝ මුදල් ජනනය කරන ඒකකයෙහි, විකුණුමට වියදම් වන පිරිවැය සහ භාවිතයේ අගය අඩු කරන ලද සාධාරණ අගයයි. වත්කමක් දරණ අගය, එම වත්කමට අදාළ ලැබෙන අගය ඉක්මවන කළ, එම වත්කම හාරිකරණය වී ඇති බව නිගමනය කරන හෙයින් එහි හාරිකරණ අගය ලේඛනගත කරනු ලැබේ. භාවිතයේ පවතින අගයන් තක්සේරු කිරීමේ දී, මුදලෙහි කාල අගය, වර්තමාන වෙළෙඳ පොළ ඇස්තමේන්තුවක් මගින් පිළිබිඹු කරන පෙර බදු වට්ටම් අනුපාතයක් සහ වත්කමට විශේෂිත අවදානම භාවිතා කොට, ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලා ඒම වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. අගැයුම් ගුණිතයන්, ප්‍රකාශිත කොටස් මිල හෝ පවත්නා වෙනත් සාධාරණ අගය පිළිබඳ දර්ශකයන් මගින් මෙම ගණන් බැලීම් සනාථ කරනු ලැබේ.

ප්‍රති අගැයුම සම කොටස් සඳහා යොදා ගැනීම සහිතව පෙර කල ප්‍රති අගැයුමට භාජන කළ දේපළ සම්බන්ධයෙන් හැර හාරිකරණයට පාත්‍ර වූ වත්කමෙහි කාර්යභාරයට අනුරූප වියදම්

ගණයන් හි ආදායම් ප්‍රකාශවල අඛණ්ඩ මෙහෙයුම්වල හාරිකරණ පාඩු හඳුනා ගෙන ඇත. මෙම අවස්ථාවන් හි පූර්ව සම කොටස් ප්‍රති අගැයුම් ප්‍රමාණය දක්වා හාරිකරණය හඳුනා ගනු ලැබේ.

කලින් හඳුනාගත් හාරිකරණ පාඩු තවදුරටත් පවතී ද, එසේත් නැත්නම් අඩු වී තිබේ ද යන්න පිළිබඳ ඇඟවීමක් තිබේ ද යන වග සෑම වාර්තාකරන දිනකම, කීර්තිනාමය හැර සෙසු වත්කම් අගයනු ලැබේ. එබඳු ඇඟවීමක් ඇත්නම්, නැවත ලැබිය හැකි ප්‍රමාණය සමාගම විසින් ඇස්තමේන්තු කරනු ලැබේ.

ඉකුත් හාරිකරණ පාඩුව හඳුනාගත් දිනයෙන් පසු, වත්කම්වල නැවත ලැබිය හැකි අගය තිරණය කිරීමට යොදාගත් ඇස්තමේන්තුවල වෙනසක් තිබේ නම් පමණක් කලින් හාරිකරණ පාඩුව ප්‍රතිවර්තනය කරනු ලැබේ.

එසේ වුවහොත් වත්කම දැනට දරන අගය නැවත ලැබිය හැකි ප්‍රමාණය දක්වා වැඩි කරනු ලැබේ.

ඉකුත් වසරවල වත්කමක හාරිකරණ පාඩුවක් හඳුනාගෙන නොතිබුණා නම්, එසේ වැඩි කළ ප්‍රමාණය ශුද්ධ වත්කම හැර, නිර්ණය කළා වූ වත්කම දරන අගයට වැඩි නොවනු ඇත.

### 2.2.4 දැනට ඉටුවන ප්‍රාග්ධන වැඩ

වත්කම ප්‍රථම වරට උපයෝජනයට යොදවන විට, දැනට ඉටුවන ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම් ගිණුමට මාරු කරනු ලැබේ.

### 2.2.5 ආයෝජන

#### දීර්ඝ කාලින ආයෝජන

දීර්ඝ කාලින ආයෝජන, ජංගම නොවන ආයෝජන හැටියට වර්ග කරන අතර, ඒවාට හාරිකරණ පාඩු අඩු කොට පිරිවැය ප්‍රමාණයට ප්‍රකාශිත ය.

එක් එක් වත්කම අනුව ආයෝජනවල තාවකාලික නොවන අගයෙහි පිරිහීමක් අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව සිදු වී තිබේ නම් හාරිකරණය සඳහා ආදායම් ප්‍රකාශයෙහි ප්‍රතිපාදන සලසනු ලැබේ.

#### කෙටි කාලින අයෝජන

ජංගම ආයෝජන පිරිවැය අනුව ප්‍රකාශිතය

### 2.2.6 භාණ්ඩ තොග

පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගය මත භාණ්ඩ තොග ගණනය කර ඇති අතර, එහි දී අභාවිත සහ ප්‍රමාණවත් වේගයෙන් භාවිතයට නොගන්නා භාණ්ඩ තොග සඳහා වෙන් කිරීම් ද අඩුකර ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය විකුණුම් ක්‍රමයන් තුළ භාණ්ඩවලට ලැබෙන විකුණුම් මිලෙන්, එම භාණ්ඩ තොග විකිණීම සඳහා දරන්නට සිදුවන්නා වූ ඇස්තමේන්තු ගත පිරිවැය සහ සම්පූර්ණ කිරීමට වැයවන ප්‍රමාණය අඩු කළ පසු එන වටිනාකම වේ.

තොගවල තථ්‍ය වටිනාකම් පිරිවැය ගණනය කිරීමේ දී භාණ්ඩ තොග පවත්නා ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමට වැය වූ පිරිවැය පහත පිරිවැය ක්‍රමවේදයන් අනුව ගණනය කර ඇත.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | - | බරතබන ලද සාමාන්‍ය පිරිවැය මත තිරණය කරන ලදී. |
| නිමි ද්‍රව්‍ය | - | සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රම පිරිවැය සහ සාමාන්‍ය ධාරිතාව මත නිෂ්පාදන පිරිවැයේ අදාළ කොටස |
| නොනිමි භාණ්ඩ | - | යොදන ද්‍රව්‍ය ප්‍රමාණය මත |
| ඇසුරුම් ද්‍රව්‍ය | - | බරතබන ලද සාමාන්‍ය පදනම මත තිරණය කළ පිරිවැයට |
| වෙනත් තොග | - | පිරිවැය මත (බර තැබූ සාමාන්‍යය අනුව) |
| මාර්ගස්ථ භාණ්ඩ | - | තථ්‍ය පිරිවැයට |

### 2.2.7 වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ, එම දේවලින් උපලබ්ධි වීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයට, හානිකරණයට වෙන් කළ ප්‍රමාණය අඩු කොට හඳුනා ගෙන ඇත. ආශ්‍රිත වෙනත් පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු වෙනත් දේ, හානිකරණයට වෙන් කළ ප්‍රමාණය අඩු කොට පිරිවැය ප්‍රමාණයට හඳුනාගෙන ඇත. වෙන්කළ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන තිබේ.

### 2.2.8 මුදල් සහ මුදල්වලට සමාන දෑ

මුදල් සහ මුදල්වලට සමාන දෑ අත ඇති මුදල් ලෙස සහ ඉල්ලුම් තැන්පතු ලෙස නිර්වචනය කර ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා, මුදල් සහ මුදල්වලට සමාන දෑ, අත ඇති මුදල් සහ ගෙවීමට ඇති බැංකු අයිරාවන් අඩු කරනු ලැබූ බැංකු තැන්පතු ලෙස හඳුනාගෙන ඇත.

වක්‍ර ක්‍රමය පදනම් කොට ගෙන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය වාර්තා කර ඇත.

## 2.3 බැරකම් සහ වෙන්කිරීම

### 2.3.1 බැරකම්

ශේෂ පත්‍රයෙහි ජංගම බැරකම් යටතේ වර්ගකර ඇති බැරකම් වන්නේ ශේෂ පත්‍ර දිනයේ සිට අවුරුද්දක් ඇතුළත ගෙවිය යුතු වන බැරකම් ය. ශේෂ පත්‍ර දිනයෙන් අවුරුද්දකට පසු ගෙවිය යුතු වන බැරකම් ජංගම නොවන බැරකම් හැටියට වර්ග කර ඇත.

වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළෙඳ ණයකරුවන් සහ වෙනත් ගෙවිය යුතු දෑ පොත්වල අගය අනුව ප්‍රකාශිත ය.

### 2.3.2 වෙන්කිරීම්, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය බැරකම්

බැඳීමක් නිරවුල් කිරීමට ආර්ථික ප්‍රතිලාභ අඩංගු සම්පත් පිටත ගලායාමක් සිදුවිය හැකිවන සහ බැඳීමේ ප්‍රමාණය ගැන පිළිගත හැකි ඇස්තමේන්තුවක් කිරීමට හැකිවන අතර ම අතීත සිදුවීමක ප්‍රතිඵල වශයෙන් සමාගමට වර්තමාන බැඳීමක් (නෛතික හෝ ගිවිසුම්ගත) පවතින විට වෙන්කිරීම් හඳුනා ගනු ලැබේ.

ආර්ථික ප්‍රතිලාභ ඇතුළට ගලාඒමක් විය හැකි අවස්ථාවක අසම්භාව්‍ය බැරකම් පවතින බව හෙළිදරව් වුවහොත් සම්පත් පිටතට ගලායාමක් සිදු කරන්නේ නැත්නම් සියළුම අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශවල සටහන් ලෙස හෙළිදරව් කරනු ලැබේ.

### 2.3.3 විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්

#### 2.3.3.1 හඳුනාගත් ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16/1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුකූලව විශ්‍රාමික පාරිතෝෂික සඳහා වෙන් කිරීම් සිදුකර ඇත. මෙම බැඳීම් සඳහා බාහිර අරමුදල් නොලැබෙන අතර, ඒවා ආයුගණක ක්‍රමය අනුව අගය කර නොමැත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ඇ පරිශිෂ්ඨයෙහි අංක 16 දරන විශ්‍රාම ප්‍රතිලාභ ව්‍යාප්තියට අනුකූලව සූත්‍ර ක්‍රමය පදනම් කොට මිල්කෝ (පුද්.) සමාගමේ විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම සකස් කර ඇත.

පාරිතෝෂික බැරකම් තීරණය කිරීමේ දී කළමනාකාරිත්වය පහත සඳහන් උපකල්පනයන් උපයෝගී කරගෙන ඇත.

| | 2011/2012 | 2010/2011 |
|---|---|---|
| පොලී අනුපාතය | 13% | 10% |
| විශ්‍රාම ගැනීමේ උපරිම වයස | අවුරුදු 60 යි | අවුරුදු 57 යි |

### 2.3.3.2 නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

අදාළ නීති සහ රෙගුලාසි අනුව සේවක පිරිසට සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලැබේ. සමාගම විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් පිළිවෙළින් 12% සහ 3% බැගින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

### 2.3.4 ප්‍රදාන සහ සහනාධාර

අදාළ පිරිවැයට ගැලපෙන කාල පරිච්ඡේදයක් තුළ ප්‍රදාන සහ සහනාධාර ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ. ක්‍රමානුකූල පදනමක් මත එම පිරිවැය සඳහා හානිපූර්ණයක් කිරීම මෙහි අරමුණයි.

සාධාරණ අගය මත ලබාදෙන මූල්‍ය ප්‍රදාන ඇතුළුව, වත්කම් ආශ්‍රිත ප්‍රදාන, ශේෂ පත්‍රයෙහි විලම්භිත කරන අතර, ආශ්‍රිත වත්කමෙහි ප්‍රයෝජනවත් කාල සීමාව තුළ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

ආදායම් ආශ්‍රිත ප්‍රදාන ලැබිය යුතු කාල සීමාව තුළ ආදායම් ප්‍රකාශයට ඇතළත් වේ.

### 2.3.5 බදු

### 2.3.5.1 වර්තමාන බදු

2006 අංක 10 දරණ දේශිය ආදායම් පනතෙහි 16 වගන්තිය අනුව සහ එයට අදාළ සංශෝධන අනුව 2006 අප්‍රේල් 01 සිට සමාගමේ ලාභය අවුරුදු 5කට ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

2011/2012 තක්සේරු වර්ෂයෙහි සිට මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති ආදායම් සහ වියදම් පාදක කොට, 2006 අංක 10 දරන දේශිය ආදායම් පනත සහ අදාළ සංශෝධනවලට අනුකූලව ගණන් බලා, මිල්කෝ (පුද්.) සමාගම ආදායම් බදු සඳහා වෙන් කිරීම් සිදු කරයි.

### 2.3.5.2 විලම්භිත බදු

ශේෂ පත්‍ර දිනට වත්කම් සහ බැරකම්වල බදු පදනමට සහ තාවකාලික මූල්‍ය වාර්තාකරණය සඳහා ඒවා දරන අගය අතර තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත බදු වෙන් කරන ලදී.

සියළු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් හඳුනාගෙන ඇත. අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ ඉදිරියට ගෙන ආ භාවිතයට නොගත් බදු බැර සහ භාවිතා නොකළ අලාභ වෙනුවෙන් යොදාගත හැකි බදු අය කළ හැකි ලාභයක් පවතින තාක් දුරට, සියළු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙන ආ භාවිතා නොකළ බදු බැර සහ භාවිතා නොකළ බදු අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලැබේ.

ඉදිරියට ගෙන ආ විලම්භිත බදු වත්කම් එක් එක් ශේෂ පත්‍ර දිනට සමාලෝචනය කරනු ලබන අතර, භාවිතා කළ හැකි විලම්භිත බදු වත්කම්වලින් සියල්ල හෝ කොටසකට ඉඩ දිය හැකි ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් තව දුරටත් නොවේ යයි අනුමාන කරන ප්‍රමාණයට අඩු කරනු ලැබේ. එක් එක් ශේෂ පත්‍ර දිනට විලම්භිත බදු වත්කම් නැවත තක්සේරු කරන අතර, අයකර ගත යුතු විලම්භිත බදු වත්කම්වලට ඉඩ දෙනු ලබන අනාගත බදු ගෙවිය යුතු ලාභය බවට පත්විය හැකි ප්‍රමාණයෙන් හඳුනා ගනු ලැබේ.

ශේෂ පත්‍ර දිනය වන විට පනවා ඇති හෝ පැනවීමට නියමිත බදු අනුපාත හෝ බදු නීති පදනම් කොට ගෙන, වත්කම් උපලබ්ධි කරනු ලබන හෝ බැරකම් නිරවුල් කරන වර්ෂයට යොදා ගනු ඇතැයි අපෙක්ෂිත බදු අනුපාත අනුව විලම්භිත වත්කම් සහ බැරකම් ගණනය කරනු ලැබේ.

සමාන කොටස්වල සෘජුවම හඳුනාගත් අයිතමයන්ට අදාළ ආදායම් බදු සමාන කොටස් තුළ හඳුනාගෙන ඇත.

වර්තමාන බදු වත්කම්, බදු බැරකම් සඳහා හිලව් කිරීමට නීත්‍යානුකූල අයිතියක් තිබේ නම් හා විලම්භිත බද්ද එකම බදු අයකළ හැකි වස්තුවකට සහ එකම බදු අධිකාරියකට අදාළ වේ නම්, විලම්භිත බදු වත්කම් විලම්භිත බදු බැරකම්වලට හිලව් කරනු ලැබේ.

2.3.5.3 **බැඳීම්**

ශේෂ පත්‍ර දිනට පැවති සියළු ද්‍රව්‍යමය බැඳීම් හඳුනාගෙන ඇති අතර මූල්‍ය ප්‍රකාශවල සඳහා වන සටහන්වල හෙළිදරව් කර ඇත.

## 2.4 ආදායම් ප්‍රකාශය

### 2.4.1 ආදායම් හඳුනා ගැනීම

**අ) භාණ්ඩ විකිණීම**

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලායනු ඇතැයි සිතිය හැකිතාක් දුරට සහ ආදායම් සහ දරන්නට සිදු වූ ආශ්‍රිත පිරිවැය පිළිගත හැකි දුරට මිණිය හැකි වන කල් හී ආදායම හඳුනාගනු ලැබේ. වෙළෙඳ වට්ටම් සහ විකුණුම් බදු අඩු කොට ලැබුණ හෝ ලැබිය හැකි ආදායමෙහි සාධාරණ අගය මත ආදායම ගණනය කරනු ලැබේ. සුවිශේෂී අවදානම් සහ පරිදාන ගැණුම්කරුට මාරු කොට ලැබිය යුතු ගෙවීම ගැන විශ්වාසය තැබිය හැකි සහ ආශ්‍රිත පිරිවැය සහ භාණ්ඩ ආපසු එවීමේ ඉඩ, පිළිගත හැකි මට්ටමට ඇස්තමේන්තු කළ හැකි කල්හී ආදායම හඳුනාගනු ලැබේ.

**ආ) පොළිය**

එකතු කර ගැනීම ගැන සැකයක් නැත්නම් කාල පදනම මත උපචිත වන පොලිය ලෙස (වත්කමෙහි ඵලදායිත්වය සැලකිල්ලට ගෙන) පොලී ආදායම හඳුනා ගනු ලැබේ.

**ඇ) වෙනත්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගෙන ඇත.

**ඇ) ලාභ සහ අලාභ**

දේපළ, පිරියත සහ උපකරණ සහ ආයෝජන ඇතුළු වෙනත් වත්කම් බැහැර කිරීම මත සිදුවන්නා වූ ආදායමක ස්වරූපය දරන ශුද්ධ ලාභ සහ අලාභ, බැහැර කිරීමෙන් ලද ආදායමෙන් වත්කම් සහ ආශ්‍රිත දේපළ, පිරියත සහ උපකරණ දරන අගය අඩු කිරීමෙන් පසු, ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත. ප්‍රති-අගැයුම් සංචිතයෙහි එම වත්කමට අදාළ ප්‍රමාණය සෘජුවම සමුච්චිත ලාභ / (අලාභ)වලට මාරු කරනු ලැබේ.

### 2.4.2 වියදම් හඳුනාගැනීම

2.4.2.1 දරන්නට සිදු වූ පිරිවැය සහ විශේෂිත අයිතමයෙහි ආදායම අතර සෘජු සම්බන්ධය මත ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනාගෙනෙ ඇත. වර්ෂයේ අලාභ ගණනයේ දී ව්‍යාපාරය පවත්වා ගැනීමේ සියළු වියදම් සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂම මට්ටමෙන් පවත්වා ගැනීම සඳහා දැරූ සියළු වියදම් ආදායමෙන් අඩුකර ඇත.

2.4.2.2 ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ දී වියදම් ක්‍රමය මගින් සමාගමේ කාර්යසාධනයට අදාළ සාධක මැනවින් ඉදිරිපත් වන බව අධ්‍යක්ෂකවරුන්ගේ මතය වන බැවින්, එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගමනය කරන ලදී.

2.4.2.3 **ණය ගැනීමේ පිරිවැය**

වත්කමකින් අපේක්ෂිත සේවය ලබාගැනීමට හෝ විකිණීමට සෑහෙන මට්ටමකින් සූදානම් වනතුරු, අපේක්ෂිත කාර්යයට සූදානම් කිරීමට අවශ්‍යයෙන් ම සැලකිය යුතු කාලයක් ගතවන අවස්ථාවන් හි දී, එම වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වන ප්‍රමාණයට හැර, ණය ගැනීමේ පිරිවැය එම පිරිවැය දරන්නට සිදු වූ කාලයේ දී සිදු වූ වියදම් හැටියට හඳුනා ගනු ලැබේ.

සුදුසුකම් ලබන වත්කම් සඳහා වියදම් කිරීම සිදුවන තුරු, විශේෂිත ණය ගැනීම් තාවකාලික ලෙස ආයෝජනය කිරීමෙන් ලැබෙන ආයෝජන ආදායම, ප්‍රාග්ධනීකරණයට සුදුසු වන ණය ගැනීමේ පිරිවැයෙන් අඩු කරනු ලැබේ.

## 2.5 පොදු

### 2.5.1 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු වැදගත් සිදුවීම් සලකා බලන ලද අතර, අවශ්‍ය තන් හි මූල්‍ය ප්‍රකාශවල අදාළ සටහන් මගින් ගැලපීම් සහ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

### 2.5.2 ආශ්‍රිත පාර්ශ්ව සමග ගනුදෙනු

ගෙවීමට ඇති මිල ගැන නොසලකා අනෙක් පාර්ශ්වයන්ගේ මූල්‍ය සහ මෙහෙයුම් තීරණ / ප්‍රතිපත්ති පාලනය කිරීමට සුවිශේෂී බලපෑම් කිරීමට හැකි වූ ගනුදෙනු ගැන හෙළිදරව් කර ඇත.

### 2.5.3 කොටසක ඉපැයීම

සමාගමේ සාමාන්‍ය කොටස්කරුවන් සතු ලාභය හෝ අලාභය, වර්ණීය හෝ වර්ණීය නොවන කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙන් කොටසකට හිමි මූලික ඉපැයීම / (පාඩුව) ගණනය කරනු ලැබේ.

### 2.5.4 නිකුත් කර ඇතත් තවමත් බලනොපැවැත්වෙන ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති

2012 ජනවාරි 01 දින හෝ එදිනට පසුව එළඹෙන මූල්‍ය කාල පරාස සඳහා යොදා ගත යුතු ශ්‍රී "ලංකා ගිණුම්කරණ ප්‍රමිති" අළුත් වෙළුමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇත.

මෙම ප්‍රමිති 2012 මාර්තු 31න් අවසන් වන වසරට බලනොපාන හෙයින් මෙම මූල්‍ය ප්‍රකාශ සම්පාදනයේ දී යොදාගැනීමක් සිදු නොවිය.

මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට, SLFRS පෙර ඇඳිය (1 FRS පෙර ඇඳියට අනුරූපව) සහ LKRS පෙර ඇඳිය (1 AS පෙර ඇඳියට අනුරූපව) ඇතුළත් වේ. SLFRS සහ LKAS යන පෙර ඇඳි සහිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රථම වරට යොදා ගැනීම SLFRS යොදා ගැනීම සේ සලකනු ඇත.

| | | 2011/2012<br>රු. | 2010/2011<br>රු. |
|---|---|---|---|
| 3. | ආදායම | | |
| | දළ විකුණුම් | 5,370,586,783 | 4,679,890,960 |
| | අඩු කළා - ජාතිය ගොඩනැගීමේ බද්ද | (107,434,572) | (130,916,907) |
| | | 5,263,152,211 | 4,548,974,053 |
| 4. | අනෙකුත් ආදායම් | | |
| | ඇමතුම්/ස්ථාවර තැන්පතු මත පොලිය - දේශිය | 49,202,811 | 63,705,180 |
| | ස්ථාවර තැන්පතු මත පොලිය - විදේශිය මුදල් (USD) | 23,978,994 | 19,936,314 |
| | කාර්යමණ්ඩල ණය පොලි ආදායම | 10,585,378 | 10,786,161 |
| | අතිරික්ත විකුණුම් | 390,665 | 447,446 |
| | කුලි ආදායම | - | 200,100 |
| | සංචාරක බංගලාවෙන් ලද ආදායම | - | 58,237 |
| | අබලි අයිතම විකිණීම | - | 90,000 |
| | උපලබ්ධි නොවූ චෙක්පත්වලට ගෙවීම | 560,645 | 1,131,073 |
| | ආපසු නොගෙවන තැන්පතු | 153,620 | 54,500 |
| | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 300,500 | 494,500 |
| | විලම්භිත ආදායම - රජයෙන් ප්‍රදාන | 400,600 | 612,106 |
| | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 1,924,000 | 2,925,000 |
| | අනියම් ආදායම් | 100,000 | - |
| | විනිමය අනුපාත වාසි | 79,648,709 | - |
| | | 167,245,922 | 100,440,617 |
| 5. | මූල්‍ය පිරිවැය | | |
| | මූල්‍ය කල්බදු මත පොලි | 5,510 | 333,253 |
| | හුවමාරු අලාභ | - | 15,171,011 |
| | ණය සඳහා පොලි | 29,478,528 | - |
| | බැංකු අයිරා සඳහා පොලි | 6,321,686 | - |
| | | 35,805,724 | 15,504,264 |

6. බද්දට පෙර (පාඩු) / ලාභ

පහත සඳහන් දෑ ඇතුළත්ව සියළු වියදම් අය කිරීමෙන් පසුව බදුවලට පෙර (පාඩු) / ලාභ ප්‍රකාශිතය

| | 2011/2012<br>රු. | 2010/2011<br>රු. |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | 9,870,934 | 8,674,785 |
| විගණන සේවා | | |
| අභ්‍යන්තර විගණන සේවා | 4,826,983 | 4,383,970 |
| බාහිර විගණන සේවා | 525,000 | 525,000 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම | 123,306,838 | 158,638,553 |
| ජාතිය ගොඩනැගීමේ බදු වියදම | 107,434,572 | 130,916,907 |
| ප්‍රචාරන සහ අලෙවි ප්‍රවර්ධන වියදම | 44,931,211 | 27,867,924 |
| පරිත්‍යාග | 23,750 | 3,000 |
| නීති වියදම් සහ වෘත්තියමය ගාස්තු | 2,190,711 | 1,813,340 |
| අඩමාන ණය සහ බොල් ණය සඳහා වෙන්කිරීම | 1,164,172 | 587,915 |
| ගව ආහාර සඳහා මෙහෙයුම් අලාභ | 16,684,254 | 23,347,247 |
| පිළිසකර කිරීම් සහ නඩත්තු වියදම් | 27,299,933 | 31,191,392 |
| කාර්යමණ්ඩල පිරිවැය | | |
| - වැටුප්, වේතන සහ ආශ්‍රිත වියදම් | 622,631,259 | 550,436,211 |
| - නිශ්චිත දායක මුදල් සැලසුම් අනුව ගෙවීම - සේ.නි.අ. සහ සේ.අ.අ. | 52,024,634 | 35,385,293 |
| - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් අනුව වියදම් - පාරිතෝෂික | 136,978,472 | 76,605,933 |

| | | | |
|---|---|---|---|
| 7. ආදායම් බදු වියදම් | | | |
| පවත්නා ආදායම් බදු ප්‍රතිපාදන | 7.1 | 10,917,993 | 27,471,930 |
| | | 10,917,993 | 27,471,930 |

| | | |
|---|---|---|
| 7.1 පවත්නා බදු වියදම්/(ආදායම්) සහ ගිණුම්කරණ (අලාභ) ලාභ | | |
| 7.1.අ | | |
| බද්දට පෙර ගිණුම්කරණ (පාඩුව)/ලාභය | (215,520,592) | 110,663,480 |
| අඩු කළා: වෙන් වෙන්ව සලකන ලද ආදායම | (83,967,966) | (100,440,617) |
| වෙළෙඳ හෝ ව්‍යාපාරයෙන් ලද ලාභය | (299,488,558) | 10,222,863 |
| අඩු කළා: නිදහස් කරන ලද ලාභය | - | (10,222,863) |
| බද්දට යටත්වන ව්‍යාපාර (පාඩුව)/ලාභය | (299,488,558) | - |
| නිදහස් කරන ලද අනෙක් ආදායම් | 23,978,994 | (21,949,389) |
| වගකිව යුතු වෙනත් ආදායම් | 59,988,972 | 78,491,228 |
| ආදායම් බදු අයකළ හැකි ගිණුම්කරණ | - | 78,491,228 |
| බදු අනුපාත | 28% | 35% |
| අයකළ හැකි ලාභය හෝ ආදායම මත බදු | 16,796,912 | 27,449,509 |
| එකතු කළා: බදු ගෙවිය යුතු ආදායම නිශ්වය කිරීමේ දී ඉඩනොදිය හැකි වියදම් මත බදු බලපෑම | | - |
| අඩු කළා: බදු ගෙවිය යුතු ආදායම නිශ්වය කිරීමේ දී ඉඩනොදිය හැකි වියදම් මත බදු බලපෑම | - | - |
| | 16,796,912 | 27,449,509 |
| 32 වගන්තිය යටතේ අඩු කිරීමට බලපාන බදු | 5,878,919 | - |
| ගැලපුම් ආදායම් මත බද්ද 35% බැගින් | 10,917,993 | 27,449,509 |
| සමාජ වගකීම් බද්ද 1.5% බැගින් | - | 411,743 |
| | 10,917,993 | 27,861,252 |
| පෙර වර්ෂය සඳහා අඩු/වැඩි ප්‍රතිපාදන | | (389,322) |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | 10,917,993 | 27,471,930 |
| 7.1.ආ ඉදිරියට ගෙන ආ බදු අලාභ | | |
| 2010/2011 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ බදු අලාභ | - | - |
| වර්ෂය තුළ සිදු වූ බදු අලාභ | | |
| වගකිව යුතු වෙනත් ආදායම් | (299,488,558) | - |
| එකතු කළා: බදු අයකළ හැකි ආදායම නිශ්වය කිරීමේ දී ඉඩදිය නොහැකි වියදම් කෙරෙහි බදු බලපෑම | 275,379,796 | - |
| අඩු කළා: බදු අයකළ හැකි ආදායම නිශ්වය කිරීමේ දී ඉඩදිය නොහැකි වියදම් කෙරෙහි බදු බලපෑම | (326,915,646) | - |
| | (351,024,408) | - |
| 32 වගන්තිය යටතේ අඩු කිරීමට බලපාන බදු | 20,996,140 | - |
| | (330,028,268) | - |

7.1.ඇ. විදේශිය ආයෝජනවලින් ලද ආදායම (විදේශිය මුදල්වලින් ස්ථිර තැන්පතු) දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ විධිවිධාන මත බද්දෙන් නිදහස් කරනු ලැබේ.

8. සාමාන්‍ය කොටසක් සඳහා (පාඩුව) ඉපයුම

කොටසක මූලික (පාඩුව) ඉපැයුම ගණනය කිරීම සමාගමේ සාමාන්‍ය කොටස්කරුවන් සඳහා හිමි (අලාභ) ලාභ බරතබන ලද, නිකුත් කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීම මත පදනම් වේ.

| | | |
|---|---|---|
| සාමාන්‍ය කොටස්වලට හිමි ශුද්ධ (අලාභය)/ලාභය | (226,438,585) | 83,191,550 |
| සාමාන්‍ය කොටස්වල බරතැබූ සාමාන්‍ය සංඛ්‍යාව | 31,945,406 | 31,945,406 |
| | (7) | 2.60 |

8.1 කොටසක් වෙනුවෙන් අඩුවිය හැකි (අලාභ)/ඉපැයුම්

සමාගම සතු අඩු ඉපැයුම් ලැබිය හැකි සාමාන්‍ය කොටස් නැති බැවින් කොටසක අඩු (පාඩු)/ඉපැයුම් ප්‍රමාණය, ඉහත සඳහන් කොටසක මූලික ඉපැයුම්/(පාඩු) ප්‍රමාණයම වේ.

9. දේපළ, පිරියත හා උපකරණ

| වත්කම් විස්තරය | පිරිවැය/ඇගයීම 2011.04.01 දිනට ශේෂය | එකතු කිරීම | 2012.03.31 දිනට ශේෂය | ක්ෂය වීම 2011.04.01 දිනට ශේෂය | වර්ෂය සඳහා අය කිරීම් | 2012.03.31 දිනට ශේෂය | අඩුවෙන් සඳහන් වටිනාකම 2012.03.31 දිනට | 2011.03.31 දිනට |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| සින්නක්කර ඉඩම් | - | 3,250,000 | 3,250,000 | - | - | - | 3,250,000 | - |
| ගොඩනැගිලි | 116,568,922 | 1,402,380 | 117,971,302 | 25,792,775 | 5,817,655 | 31,610,430 | 86,360,873 | 90,776,148 |
| පිරියත හා යන්ත්‍ර | 421,619,739 | 390,648,678 | 812,268,417 | 123,746,681 | 67,687,925 | 191,434,606 | 620,833,811 | 297,873,058 |
| ලී බඩු හා සවිකිරීම් | 24,502,751 | 2,193,975 | 26,696,726 | 14,817,029 | 2,683,717 | 17,500,746 | 9,195,980 | 9,685,722 |
| විද්‍යාගාර උපකරණ | 31,053,411 | 1,078,440 | 32,131,851 | 20,556,767 | 2,947,079 | 23,503,846 | 8,628,005 | 10,496,644 |
| මෝටර් වාහන | 113,674,722 | - | 113,674,722 | 113,185,302 | 242,432 | 113,427,734 | 246,988 | 489,420 |
| මෙවලම් සහ උපකරණ | 175,945,680 | 5,255,420 | 181,201,100 | 139,892,407 | 11,040,695 | 150,933,102 | 30,267,998 | 36,053,273 |
| බෝතල් සහ ඇසුරුම් පෙට්ටි | 213,454,027 | 6,379,445 | 219,833,472 | 167,127,615 | 19,710,741 | 186,838,356 | 32,995,116 | 46,326,412 |
| පරිගණක උපකරණ | 17,423,567 | 686,612 | 18,110,179 | 5,821,188 | 3,861,075 | 9,682,263 | 8,427,916 | 11,602,379 |
| පරිගණක මෘදුකාංග | 2,587,209 | - | 2,587,209 | 2,533,679 | 53,529 | 2,587,209 | - | 53,530 |
| බෝතල් ශිතකය | 46,382,178 | 7,166,524 | 53,548,702 | 36,980,607 | 4,040,072 | 41,020,679 | 12,528,023 | 9,401,571 |
| කාර්යාල උපකරණ | 4,233,577 | 511,236 | 4,744,813 | 2,417,014 | 584,344 | 3,001,358 | 1,743,455 | 1,816,563 |
| කිරි බඳුන් | 41,302,468 | 3,609,391 | 44,911,859 | 33,417,173 | 3,094,386 | 36,511,559 | 8,400,300 | 7,885,295 |
| | 1,208,748,252 | 422,182,101 | 1,630,930,353 | 686,288,235 | 121,763,650 | 808,051,885 | 822,878,467 | 522,460,017 |
| කල්බදු මත ඇති වත්කම් | | | | | | | | |
| පිරියත හා යන්ත්‍ර | 15,431,880 | - | 15,431,880 | 5,143,960 | 1,543,188 | 6,687,148 | 8,744,732 | 10,287,920 |
| | 15,431,880 | - | 15,431,880 | 5,143,960 | 1,543,188 | 6,687,148 | 8,744,732 | 10,287,920 |
| | 1,224,180,132 | 422,182,101 | 1,646,362,233 | 691,432,195 | 123,306,838 | 814,739,033 | 831,623,199 | 532,747,937 |

9.1 ප්‍රති ඇගැයීම

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම සතු ගොඩනැගිලි, බෝතල් හා ඇසුරුම් පෙට්ටි, පරිගණක මෘදුකාංග, කිරි බඳුන් හැර සෙසු වත්කම් වරලත් ආගණන තක්සේරුකරු එස්.එන්. විජේපාල (ආගණන ඩිප්ලෝමාධාරී) CT, B.Sc වතු කළමනාකරණ, M.Sc (නාගරික ඉඩම් තක්සේරු) විසින් 2008 අප්‍රේල් මස ප්‍රති ඇගයුමට භාජන කරන ලදුව සමස්ත අගය රු. 500,409,271/-ක් වීම හේතුවෙන් ඇති වූ රු. 336,454,462/-ක් වූ අතිරික්තය ප්‍රත්‍යාගණන ගිණුමට බැර කරන ලදි. ප්‍රති ඇගයුම් සංචිතය 2009 මාර්තු 31 දිනට ගිණුම්ගත කර ඇති බැවින් වර්ෂයේ ක්ෂය අයකිරීම සඳහා බලපෑමක් ඇත.

## 10. කාර්යයේ නියුතු ප්‍රාග්ධන වැඩ

| | 2011.04.01 දිනට ශේෂය | වර්ෂය තුළ දැරූ වියදම් | වර්ෂය තුළ යෙදූ ප්‍රාග්ධනය | 2012.03.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| රාගම රෝහලේ අලෙවිසැල ඉදිකිරීම | 44,157 | - | 12,000 | 32,157 |
| කරාපිටිය රෝහලේ අලෙවිසැල ඉදිකිරීම | 11,985 | - | - | 11,985 |
| අප ජල පිරියම් යන්ත්‍රාගාරය ඉදිකිරීම | 16,345,529 | - | - | 16,345,529 |
| වැසි ජලය බැහැර කිරීමේ පද්ධතිය | 1,085,083 | - | - | 1,085,083 |
| කරලියැද්ද සිවිල් ඉදිකිරීම් (පුද්.) ඉඩම | 51,871 | - | 25,935 | 25,936 |
| කුඩා ශීතකරන මධ්‍යස්ථානය ඉදිකිරීම - ටිලිකල්ට්‍රි | 1,041,251 | - | - | 1,041,251 |
| මධ්‍යම ගබඩාව සඳහා රාක්ක තැනීම | 787,085 | 1,097,442 | 243,556 | 1,640,971 |
| නල්ලතන්නියේ අලෙවිසැල ඉදිකිරීම | - | 705,489 | - | 705,489 |
| සිවිල් නඩත්තු රුවන්වැල්ල MCC | - | 2,497,273 | - | 2,497,273 |
| UHT යන්ත්‍රාගාර (දෙකක්) ඉදිකිරීම (CMF & PMF) - 600M | - | 750,577,944 | 386,671,999 | 363,905,945 |
| කොළඹ කිරි කම්හලේ ආපනශාලාව | - | 3,008,188 | - | 3,008,188 |
| හානි සිදු වූ පොලොන්නරුව කිරි කම්හලේ තාප්පය නැවත ඉදිකිරීම | - | 1,546,613 | - | 1,546,613 |
| ගොඩනැගිල්ලක් ඉදිකිරීම | - | 1,053,122 | - | 1,053,122 |
| දිගන කිරි කම්හල - UHT අමතර කොටස් සහ සිවිල් ඉදිකිරීම් | - | 991,150 | - | 991,150 |
| පොලොන්නරුව කිරි කම්හලේ කල්බදු දේපළ ස්ථාපනය සටහන අංක 10.1 යෝගට් මිශ්‍ර කරන යන්ත්‍රාගාරය | - | 103,746,485 | - | 103,746,485 |
| | 19,366,961 | 865,223,706 | 386,953,490 | 497,637,177 |

### 10.1 සටහන

ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවෙන් මූල්‍ය කල්බදු පදනම මත ලබා ගන්නා ලද යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රාගාරය ශේෂ පත්‍ර දිනට පොලොන්නරුවේ කිරි කර්මාන්ත ශාලාවේ සවිකිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

| | | සටහන | 2011/2012 රු. | 2010/2011 රු. |
|---|---|---|---|---|
| **11.** | **පශු සම්පත්** | | | |
| | පශු සම්පත් | | 305,900 | 1,431,645 |
| | | | 305,900 | 1,431,645 |
| **12.** | **තොග** | | | |
| | අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය | **12.1** | 145,632,097 | 119,012,506 |
| | දැනට ඉටුවන වැඩ | | 1,040,502 | 1,445,255 |
| | නිමි භාණ්ඩ | | 131,003,897 | 44,174,890 |
| | පාරිභෝජ්‍ය භාණ්ඩ | **12.2** | 203,408,433 | 193,204,694 |
| | මාර්ගස්ථ භාණ්ඩ | **12.3** | 13,564,597 | 1,367,402 |
| | තොග සඳහා ප්‍රතිපාදන | **12.4** | (11,352,787) | (11,352,787) |
| | | | 483,296,739 | 347,851,961 |
| **12.1** | **අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය** | | | |
| | අමුද්‍රව්‍ය - කිරිපිටි නිෂ්පාදන | | 18,604,219 | 14,080,669 |
| | ඇසුරුම් ද්‍රව්‍ය - කිරිපිටි නිෂ්පාදන | | 108,510,152 | 88,111,421 |
| | ඇසුරුම් ද්‍රව්‍ය - ගව ආහාර | | 618,344 | 429,497 |
| | අමු කිරි තොගය | | 11,365,895 | 4,420,779 |
| | බෙහෙත් සහ වෙනත් තොග | | 6,533,487 | 11,970,140 |
| | | | 145,632,097 | 119,012,506 |
| **12.2** | **පාරිභෝජ්‍ය භාණ්ඩ** | | | |
| | සාමාන්‍ය ගබඩාව | | 22,861,030 | 25,423,147 |
| | ඉංජිනේරු ගබඩාව | | 148,169,701 | 135,212,658 |
| | මෝටර් ගබඩාව | | 11,864,707 | 11,072,278 |
| | ඉන්ධන සහ ලිහිසි තෙල් ගබඩාව | | 16,056,498 | 13,469,273 |
| | කාර්යමණ්ඩල සුබසාධන - කිරිපිටි | | - | 175,000 |
| | කිරි බඳුන් තොගය | | 4,456,497 | 7,852,338 |
| | | | 203,408,433 | 193,204,694 |
| **12.3** | **මාර්ගස්ථ භාණ්ඩ** | | | |
| | මාර්ගස්ථ නිමි භාණ්ඩ | | - | 456,206 |
| | මාර්ගස්ථ විද්‍යාගාර උපකරණ | | 125,798 | 125,798 |
| | මාර්ගස්ථ අමුකිරි | | 6,969,492 | 4,315,748 |
| | මාර්ගස්ථ සාන්ද්‍රිත කිරි | | 3,220,925 | |
| | යෝගට් මුහුන් | | 3,248,382 | 925,970 |
| | දැව් තෙල් | | - | (4,456,320) |
| | | | 13,564,597 | 1,367,402 |
| **12.4** | **තොග සඳහා වෙන්කිරීම්** | | | |
| | ඇසුරුම් ද්‍රව්‍ය | | (9,420,229) | (10,082,202) |
| | සාමාන්‍ය ගබඩාව | | (332,731) | (213,355) |
| | ඉංජිනේරු ගබඩාව | | (1,523,657) | (986,336) |
| | ඉන්ධන ගබඩාව | | (76,170) | (70,894) |
| | | | (11,352,787) | (11,352,787) |

12.5 මූල්‍ය ආයතනවලින් විවිධ ආධාර ලබා ගැනීම සඳහා සුරැකුම් වශයෙන් තබා ඇති තොග මෙම මූල්‍ය ප්‍රකාශවල අංක 28 දරණ සටහනෙහි දක්වා ඇත.

| | | සටහන | 2011/2012 රු. | 2010/2011 රු. |
|---|---|---|---|---|
| **13.** | **වෙළෙඳ සහ අනෙකුත් ලැබීම්** | | | |
| | වෙළෙඳ ණයගැතියෝ | **13.1** | 299,775,664 | 211,078,748 |
| | ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ | **13.2** | 548,992,655 | 429,522,058 |
| | වෙනත් ණයගැතියෝ | **13.3** | 6,875,271 | 7,134,521 |
| | අත්තිකාරම්, තැන්පතු සහ පෙර ගෙවීම් | | 69,147,147 | 71,550,530 |
| | කාර්යමණ්ඩලයට ලබාදුන් ණය | **13.4** | 133,376,779 | 133,190,033 |
| | ආනයන පාලනය | | 1,561,825 | 3,395,194 |
| | ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලී | | 52,500,649 | 36,110,088 |
| | ඩබ්.එච්.ටී. ලැබීම් | | 10,493,879 | |
| | වෙනත් ලැබිය යුතු දේ | | 740,000 | 3,499,556 |
| | | | 1,123,463,869 | 895,480,728 |
| **13.1** | **වෙළෙඳ ණයගැතියෝ** | | | |
| | මුළු ණයගැතියෝ | | 331,729,866 | 255,682,415 |
| | අඩු කළා: අඩමාන ණය සඳහා වෙන්කිරීම | | (31,954,202) | (44,603,667) |
| | | | 299,775,664 | 211,078,748 |
| **13.2** | **ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ** | | | |
| | පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු දේ - වියදම් ප්‍රතිපූරණය | | 6,437,752 | 4,010,626 |
| | ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - පවත්නා කිරි ගෙවීම් සහනාධාර - වර්තමාන | | 190,930,979 | 147,007,598 |
| | ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - කිරි ගෙවීම් සහනාධාර - 2006ට පෙර | | 34,771,803 | 34,771,803 |
| | ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - කිරියා පරිවර්තනය (13.5) | | 347,961,144 | 347,961,144 |
| | ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - කිරි කර්මාන්තශාලා පවත්නා ගිණුම | | 1,117,224 | 1,117,224 |
| | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු දේ | | 94,333 | 197,800 |
| | ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - NLDB/Lanlib | | 3,000,000 | 3,000,000 |
| | ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දේ - කොටස් නිකුතුව | | - | 12,954,040 |
| | | | 584,313,235 | 551,020,235 |
| | අඩුකළා: අඩමාන ලැබීම් සඳහා වෙන්කිරීම | | (35,320,580) | (121,498,177) |
| | | | 548,992,655 | 429,522,058 |
| **13.3** | **වෙනත් ණයගැතියෝ** | | | |
| | මුළු ලැබිය යුතු දේ | | 6,875,271 | 7,134,521 |
| | අඩුකළා: අඩමාන ලැබීම් සඳහා වෙන්කිරීම | | - | - |
| | | | 6,875,271 | 7,134,521 |
| **13.4** | **කාර්යමණ්ඩල ණයකරුවෝ** | | | |
| | මුළු ලැබිය යුතු දේ | | 133,376,779 | 133,190,033 |
| | අඩුකළා: අඩමාන ලැබීම් සඳහා වෙන්කිරීම | | - | - |
| | | | 133,376,779 | 133,190,033 |

13.5 මෙම මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 1.1 හි සඳහන් ගිවිසුම පරිදි, මෙම මුදල් ප්‍රමාණය ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතුව ඇත. තව ද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම තම 2000 අගෝස්තු 08 දින දරණ ලිපි මගින් විස්තර කර ඇති පරිදි, 1998 පෙබරවාරි 03ට පැවති බැරකම්වල ප්‍රතිඵල වශයෙන් ඇතිවන අතිරේක බැරකම් ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු හැටියට ගිණුම්ගත කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

එබඳු අයකර ගත යුතු ප්‍රමාණයන්, අංක 22.1 සටහනෙහි දක්වා ඇති අයබදු හා වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකිරීමට යොදා ගත හැකි ද යන වග ශ්‍රී ලංකා රජය සමග සමාගම විසින් සාකච්ඡා කරනු ලැබේ. එබැවින් එම ශේෂ ආපසු අයකර ගැනීම රජයේ තීරණය මත රඳා පවතී.

| | | 2011/2012 රු. | 2010/2011 රු. |
|---|---|---|---|
| **14.** | **ආයෝජන** | | |
| **14.1** | **කෙටි කාලීන ආයෝජන** | | |
| | මහජන බැංකුව - සංස්ථාපිත බැංකු ඒකකය | 175,100,000 | 25,500,000 |
| | ලංකා බැංකුව - විදේශීය ගනුදෙනුකාර ඒකකය | - | 439,623,649 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | - | 150,000,000 |
| | ලංකා බැංකුව - භාණ්ඩාගාරය | - | 315,500,000 |
| | | 175,100,000 | 930,623,649 |
| **14.2** | **දිගුකාලීන ආයෝජන** | | |
| | ලංකා බැංකුව - භාණ්ඩාගාරය | 315,500,000 | |
| | ස්ථිර තැන්පතු - ලංකා බැංකුව ඇ.ඩො. 4,095,896.38 | 523,660,352 | - |
| | | 839,160,352 | - |

සටහන් අංක 19හි සඳහන් කොට ඇති පරිදි රු. 839,160,352/- ක ආයෝජන, ලබාගත් ණය සඳහා සුරැකුම් වශයෙන් තබා ඇත. ඒ අනුව එය දිගුකාලීන ආයෝජනයක් වශයෙන් වර්ගීකරණය කොට ඇත.

| | | 2011/2012 | 2010/2011 |
|---|---|---|---|
| **15.** | **මුදල් සහ මුදලට සමාන දේ** | | |
| | බැංකුවලට අනුව ශේෂය | 29,892,575 | 393,001,398 |
| | අතැති සුළු මුදල් | 3,115,191 | 1,345,384 |
| | | 33,007,766 | 394,346,782 |
| **16.** | **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | |
| | ප්‍රකාශිත ප්‍රාග්ධන ප්‍රමාණය | 31,945,406 | 31,945,406 |
| | | රු. | රු. |
| | ප්‍රකාශිත ප්‍රාග්ධන වටිනාකම | 319,454,060 | 319,454,060 |
| **17** | **ප්‍රාග්ධන සංචිත** | | |
| **17.1** | **පිරියත සහ යන්ත්‍ර ලබාගැනීම සහ තත්ත්වයෙන් උසස් කිරීම සඳහා සංචිත** | | |
| | රඳවාගත් ඉපැයීම්වලින් මාරු කළා | 25,000,000 | 25,000,000 |
| | | 25,000,000 | 25,000,000 |

ඉහත සඳහන් සංචිතය 2008 / 2009 වර්ෂයේ ආදායම් සංචිතයෙන් ගොඩනගන ලදී. එය බලශක්ති යන්ත්‍රාගාරය, වාණුහරණ යන්ත්‍ර ආදී වැඩි ධාරිතාවක් ඇති යන්ත්‍රාගාර සහ යන්ත්‍ර ලබා ගැනීමට යොදා ගන්නා ලදී.

| | | 2011/2012 | 2010/2011 |
|---|---|---|---|
| **18.** | **නිදන් අරමුදල** | | |
| | රඳවාගත් ඉපැයීම්වලින් මාරුකළා | 1,689,778 | 1,689,778 |
| | | 1,689,778 | 1,689,778 |

ගොවියන්ට කිරි බඳුන් විකිණීමෙන් උපයාගත් මුදල යොදවා නිදන් අරමුදල නිර්මාණය කරන ලදී. මෙම අරමුදල ආපසු අයකර ගැනීමේ පදනම මත ගොවීන්ට නිකුත් කරන දෑවල මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට භාවිතා කෙරේ.

19. ණය සහ ණය ගැණුම්

19.1 පොලී සහිත ණයට ගැණුම්

| | 2011/2012 | | | 2010/2011 | | |
|---|---|---|---|---|---|---|
| | අවුරුද්දක් තුළ ගෙවිය යුතු (රු.) | අවුරුද්දකට පසු ගෙවිය යුතු මුළු ගණන (රු.) | මුළු ගණන (රු.) | අවුරුද්දක් තුළ ගෙවිය යුතු (රු.) | අවුරුද්දකට පසු ගෙවිය යුතු (රු.) | මුළු ගණන (රු.) |
| අඩු කළා ණයකරුවෝ ණයට දීම | 16,668,926 | 87,077,559 | 103,746,485 | 423,239 | - | 423,239 |
| සහ ණයට ගැනීම - බැංකු | 70,000,020 | 555,150,539 | 625,150,559 | - | - | - |
| | 86,668,946 | 642,228,098 | 728,897,044 | 423,239 | - | 423,239 |

| | 2011/2012 රු. | 2010/2011 රු. |
|---|---|---|
| **19.1.1 දළ මූල්‍ය කල්බදු - ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව** | | |
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | 428,749 | 5,573,737 |
| එකතු කළා: වර්ෂය තුළ එකතු කිරීම් | 154,203,936 | - |
| අඩු කළා: වර්ෂය තුළ ගෙවීම් | (428,749) | (5,144,988) |
| වර්ෂය අවසානයේ ශේෂය | 154,203,936 | 428,749 |
| අත්හිටවූ පොලී | | |
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | 5,510 | 472,893 |
| වර්ෂය තුළ ලබාගත් කල්බදු පහසුව සඳහා අත්හිටවූ පොලිය | 50,457,451 | - |
| අඩු කළා: ආදායම් ප්‍රකාශයට මාරු කළ ප්‍රමාණය | (5,510) | (467,383) |
| වර්ෂය අවසානයේ ශේෂය | 50,457,451 | 5,510 |
| ශුද්ධ වගකීම | 103,746,485 | 423,239 |
| වර්තමාන කල්පිරුන ප්‍රමාණය | 16,668,926 | 423,239 |
| දීර්ඝ කාලීන කල්පිරුන ප්‍රමාණය | 87,077,559 | - |
| | 103,746,485 | 423,239 |
| **19.1.2 බැංකු ණය සහ ණයට ගැනීම් - ලංකා බැංකුව** | | |
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | - | - |
| වර්ෂය තුළ ලැබීම් | 665,983,904 | - |
| අඩු කළා: වර්ෂය තුළ ගෙවීම් | (40,833,345) | - |
| වර්ෂය අවසානයේ දී ශේෂය | 625,150,559 | - |
| | | - |
| වර්තමාන කල්පිරුන ප්‍රමාණය | 70,000,020 | - |
| දීර්ඝ කාලීන කල්පිරුන ප්‍රමාණය | 555,150,539 | - |
| | 625,150,559 | - |
| **19.2 පොලී රහිත ණයට ගැණුම්** | | |
| දිගු කාලීන කොටස | | |
| ජාතික කිරි මණ්ඩලය | 2,108,063 | 2,108,063 |
| කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යාංශය | 83,590,654 | 83,590,654 |
| | 85,698,717 | 85,698,717 |

19.3 **මෙම මූල්‍ය ප්‍රකාශ වල අංක 28 සටහනේ ඉහත ණය සහ ණය ගැනීම් සඳහා සුරැකුම් වශයෙන් යොදා ඇති වත්කම් දැක්වේ.**

| 20 | විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් - පාරිතෝෂික | | 2011/2012 රු. | 2010/2011 රු. |
|---|---|---|---|---|
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | | 201,703,631 | 125,097,698 |
| | වර්ෂය සඳහා සේවා පිරිවැය | | 19,759,918 | 13,718,742 |
| | පොලී පිරිවැය | | 26,221,472 | 12,509,769 |
| | උපකල්පන වෙනස් වීම නිසා ඇති වූ ලාභය/අලාභය | | 94,392,178 | 59,228,640 |
| | වර්ෂය තුළ ගෙවීම් | | (3,395,096) | (8,851,220) |
| | වර්ෂය අවසානයේ දී ශේෂය | | 338,682,103 | 201,703,629 |
| 21 | රාජ්‍ය ප්‍රදාන | | | |
| 21.1 | වර්ෂය ආරම්භයේ දී ශේෂය | | 20,757,825 | 22,567,086 |
| | වර්ෂය තුළ ලද ප්‍රදාන | | 8,094,492 | 7,860,285 |
| | වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයෙන් හඳුනාගත් ප්‍රදාන | | (400,600) | (9,669,546) |
| | ලැබීම්වලට එරෙහි හඳුනාගත් ප්‍රදාන | | (12,954,033) | - |
| | වර්ෂය අවසානයේ දී ශේෂය | 21.2 | 15,497,684 | 20,757,825 |
| 21.2 | විලම්භිත රාජ්‍ය ප්‍රදාන | | | |
| | පොලොන්නරුව කර්මාන්තශාලාවට ප්‍රදාන | | - | 12,954,034 |
| | සමන්තුරේට ප්‍රදාන | | 1,892,800 | 2,038,400 |
| | තිරුක්කෝවිල් සඳහා ප්‍රදාන | | 1,931,000 | 1,931,000 |
| | තිම්ලතිවි සඳහා ප්‍රදාන | | 2,340,000 | 2,520,000 |
| | කිරි බඳුන් ප්‍රදාන | | 114,392 | 114,391 |
| | වත්කම් ප්‍රදාන | | 8,094,492 | - |
| | අලෙවිසැල් 14ට කළ ප්‍රදාන | | 1,125,000 | 1,200,000 |
| | | | 15,497,684 | 20,757,825 |
| 22 | වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දේ | | | |
| | වෙළෙඳ ණය හිමියෝ | | 202,147,590 | 88,504,986 |
| | වියදම් ණයහිමියෝ | | 37,546,358 | 105,859,187 |
| | වෙනත් ගෙවීම් | 22.2 | 622,623,191 | 628,757,035 |
| | | | 862,317,139 | 823,121,208 |

22.1 වෙනත් ගෙවීමට ඇති මුදල්වලට දීරඝ කාලීනව හිඟව තිබෙන ශේෂයක් වන රු. 512,468,267/- ඇතුළත් ය. එයට "සීමාසහිත ලංකා කිරියා කිරි කර්මාන්ත (පුද්.)" සමාගමෙන් වත්කම් සහ බැරකම් "සීමාසහිත මිල්කෝ (පුද්.)" සමාගමට මාරු කළ දිනයේ සිට හිඟව පැවති රු. 505,521,564/- ඇතුළත් ය. ඉහත දැක් වූ මුදලට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සහ වෙනත් රජයේ ආයතනවලට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත බැරකම් ඇතුළත් ය.

එබඳු අයකර ගත යුතු මුදල් අංක 13.5 හි සඳහන් මුදල්වලට හිලව් වශයෙන් යොදා ගැනීම ගැන සමාගම දැන් රජය සමග සාකච්ඡා පවත්වයි.

## 23. ගෙවිය යුතු ආදායම් බදු

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | 38,252,081 | 53,313,361 |
| එකතු කළා: වර්ෂය සඳහා වෙන්කිරීම් ආදායම් බදු | 10,917,993 | 27,471,930 |
| එස්ආර්එල් | - | 412,078 |
| | 49,170,074 | 81,197,369 |
| අඩු කළා: වර්ෂය තුළ සිදුකළ ගෙවීම් | (9,059,952) | (27,225,241) |
| බදු බැර | | |
| ආර්ථික සේවා බද්ද | (13,652,651) | (12,015,317) |
| රඳවා ගැනීමේ බද්ද | - | (3,704,730) |
| ගෙවිය යුතු දළ ආදායම් බද්ද | 26,457,471 | 38,252,081 |
| අඩු කළා: ලැබිය යුතු ර.ගැ.බදු | (7,002,142) | (10,493,879) |
| ශුද්ධ බදු වගකීම් වර්ෂය අවසානයට | 19,455,329 | 27,758,202 |

## 24. බැංකු අයිරා

| | | |
|---|---|---|
| ලංකා බැංකුව - 1758 | 165,522,883 | - |
| ලංකා බැංකුව - 1766 | 10,364,814 | 3,197,414 |
| මහජන බැංකුව - 41180210331 | 91,843,136 | 66,795,478 |
| මහජන බැංකුව - 41120210937 | 15,152,658 | 9,017,530 |
| ලංකා බැංකුව - 74000111100000 | 1,235,552 | 6,302,476 |
| ලංකා බැංකුව - 1279942 | - | 3,196,463 |
| ලංකා බැංකුව - 20655230 | 1,368,465 | - |
| මහජන බැංකුව - 134-1-001-2083302 | 31,217 | - |
| අරමුදල් මාරු කිරීම | 89,366 | |
| | 285,608,091 | 88,509,361 |

**25. හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳීම්**

ගිවිසම්ගත වුව ද ප්‍රතිපාදන සලස්වා නැති ප්‍රාග්ධන බැඳීම් ද මණ්ඩලය මගින් බලය පවරා ඇතත් ගිවිසුම්ගත නොවූ ප්‍රාග්ධන බැඳීම ද ශේෂ පත්‍ර දිනට ඉතිරිව නොතිබුණි.

**26. අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්**

**26.1 අසම්භාව්‍ය බැරකම්**

ශේෂ පත්‍ර දිනයට කිසිදු අසම්භාව්‍ය බැරකමක් තිබී නොමැත.

**26.2 අසම්භාව්‍ය වත්කම්**

ශේෂ පත්‍ර දිනයට කිසිදු අසම්භාව්‍ය වත්කමක් තිබී නොමැත.

**27. සම්බන්ධිත පාර්ශ්වයන් හෙළිදරව් කිරීම.**

**27.1 සත්‍ය කොටස් අයිතිය සහ උපරිම අයිතිය**

සමාගම සම්පූර්ණයෙන් ම රජයට අයත් ව්‍යවසායක් වන අතර සමාගමේ සාමාන්‍ය කොටස්වලින් 100% ක්ම රජය සතු වේ.

**27.2 මුඛ්‍ය කළමනාකාර නිලධාරී පිරිස පිළිබඳ තොරතුරු**

සමාගමේ ක්‍රියාකාරකම්, ආශ්‍රිත පාර්ශ්වයන් ඇතුළු සියළු අධ්‍යක්ෂවරුන්ගේ (විධායක හෝ වෙනත්) කටයුතු සෘජුව හෝ වක්‍රව සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය පිළිබඳව බලය හා වගකීම දරන පිරිස මුඛ්‍ය කළමනාකරණ පිරිස වේ.

වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන්ගේ සහ මුඛ්‍ය කළමනාකාර පිරිසගේ පාරිශ්‍රමික පහත සඳහන් පරිදි වේ.

| | 2011/2012 | 2010/2011 |
|---|---|---|
| | රු. | රු. |
| කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 9,870,934 | 8,674,785 |

**27.3 ආශ්‍රිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු**

සමාගමේ අධ්‍යක්ෂවරුන් කළ ප්‍රකාශ පරිදි, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව හෙළි කළ යුතු විශේෂිත පාර්ශ්වීය ගනුදෙනු අදාළ කාලය තුළ සිදු නොවිය.

28. **ඇප වශයෙන් තබා ඇති වත්කම්**

පහත සඳහන් වත්කම් වගකීම් සඳහා ඇප වශයෙන් තබා ඇත.

| වගකීම්වල ස්වභාවය සහ බැංකුවේ නම | | ලබාදුන් ණය/පහසුව රු. | 2012.03.31ට ගෙවිය යුතුව තිබූ ශේෂය රු. | 2011.03.31ට ගෙවිය යුතුව තිබූ ශේෂය රු. | අපසු ගෙවීම | | තැබූ ඇපය |
|---|---|---|---|---|---|---|---|
| ලංකා බැංකුව ලබාදුන් ණය | | 665,983,904 | 625,150,559 | - | රු.5,833,335/- බැගින් වූ මාසික වාරික 120න් ගවීම | i) | ලංකා බැංකුවේ තැබූ රු.315,500,000 ක් වටිනා ස්ථිර තැන්පතු. |
| | | | | | | ii) | ලංකා බැංකුවේ තැබූ ඇ.ඩො. 4,095,896.38 ක් වටිනා ස්ථිර තැන්පතු |
| ලංකා බැංකුව ලබාදුන් අයිරා පහසුකම් | | 100,000,000 | 165,522,883 | - | ඉල්ලීම අනුව | i) | ඇසුරුම් ද්‍රව්‍ය තොග, නිමි භාණ්ඩ සහ සමාගමේ වර්තමාන සහ අනාගත පොත් දිනවලට බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නාරාහේන්පිට නාවල පාරේ අංක 45 දරණ ස්ථානයෙහි ගබඩා කර ඇති වෙනත් චංචල දේපළ ඇතුළු අලෙවියට යටත් චංචල දේපළ සහ බැඳීමෙහි ප්‍රතිඵල වශයෙන් පවත්නා දේ. |
| මහජන බැංකුව ලබාදුන් බැංකු අයිරා පහසුකම් | | 45,000,000 | | - | ඉල්ලීම අනුව | i) | මහජන බැංකුවේ තැබූ රු.50,000,000 ක් වටිනා ස්ථිර තැන්පතු |
| | | 20,000,000 | 91,843,136 | - | ඉල්ලීම අනුව | ii) | මහජන බැංකුවේ තැබූ රු.25,000,000 ක් වටිනා ස්ථිර තැන්පතු. |
| | | 40,000,000 | | - | ඉල්ලීම අනුව | iii) | මහජන බැංකුවේ තැබූ රු.50,000,000 ක් වටිනා ස්ථිර තැන්පතු. |

29. **ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

ආපසු ලබාගත නොහැකි ණයක් වශයෙන් රු. 13,823,199ක් වන ශේෂය, 2012 ජුලි 31 දිනට වසර 10 ඉක්මවන හෙයින් විශේෂිත කපාහැරීමක් සේ සලකා බොල් ණය සහ අඩමාන ණය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදනවලට එරෙහිව පොත්වලින් කපා හරින ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කළේ ය. මෙම නිර්දේශය සාමාන්‍ය යෝජනා ස්ථිරත්වයක් වශයෙන් 2012 ජුලි 31 දින ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 (2005 දී සංශෝධිත) ට අනුකූලව අනුමත කරන ලදී. ශේෂ පත්‍ර දිනට පසුව එළඹුන තීරණයක් වශයෙන් මෙය මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කර ඇත.

30. **සංසන්දනාත්මක සංඛ්‍යා**

වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතා අනුව අවශ්‍ය තන්හි සංසන්දනාත්මක සංඛ්‍යා නැවත වර්ගීකරණය කර ඇත.

| | | 2011/2012 | 2010/2011 | 2009/2010 | 2008/2009 | 2007/2008 |
|---|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | | | | |
| පිරිවැටුම (ශුද්ධ) | Rs. 000' | 5,263,152 | 4,548,974 | 4,093,052 | 4,242,074 | 3,238,452 |
| දළ ලාභය | Rs. 000' | 249,325 | 536,949 | 697,490 | 731,398 | 452,203 |
| බද්දට පෙර ලාභය | Rs. 000' | (215,521) | 110,664 | 338,725 | 351,737 | 109,374 |
| ආදායම් බදු වියදම් | Rs. 000' | (10,918) | (27,472) | (37,975) | (19,581) | (5,107) |
| බද්දට පසු ලාභය | Rs. 000' | (226,438) | 83,192 | 300,750 | 332,156 | 104,267 |
| **ශේෂ පත්‍රය** | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | Rs. 000' | 319,454 | 319,454 | 319,454 | 306,500 | 306,500 |
| රඳවාගත් ඉපැයුම් | Rs. 000' | 964,840 | 1,191,279 | 1,108,087 | 836,699 | 429,637 |
| නිදන් අරමුදල | Rs. 000' | 1,690 | 1,690 | (11,264) | 1,690 | 1,682 |
| පිරියත සහ යන්ත්‍රෝපකරන වැඩිදියුණුව සහ ප්‍රතිස්ථාපනය සඳහා සංචිතය | Rs. 000' | 25,000 | 25,000 | 25,000 | 25,000 | 25,000 |
| ප්‍රතිඇගැයුම් සංචිතය | Rs. 000' | 336,455 | 336,455 | 336,455 | 336,455 | |
| කොටස්කරුවන්ගේ අරමුදල | Rs. 000' | 1,647,439 | 1,873,878 | 1,777,732 | 1,506,344 | 762,819 |
| දේපළ, පිරියත සහ උපකරණ | Rs. 000' | 2,168,421 | 552,115 | 572,074 | 607,598 | 346,041 |
| ශුද්ධ ජංගම වත්කම්/බැරකම් | Rs. 000' | 561,125 | 1,629,923 | 1,452,398 | 1,114,635 | 677,114 |
| දිගු කාලීන (විලම්භනය කළ බැරකම්) | Rs. 000' | (1,082,107) | (308,160) | (233,787) | (216,297) | (260,678) |
| **අනුපාත** | | | | | | |
| කොටසක ඉපැයුම | Rs. | 7.09 | 2.60 | 9.41 | 10.84 | 3.40 |
| කොටස්කරුවන් සඳහා සම්පූර්ණ වත්කම්/වාර ගණන | | 2.42 | 1.67 | 1.66 | 1.75 | 2.39 |
| කොටසකට ශුද්ධ වත්කම | Rs. | 51.57 | 58.66 | 56.06 | 49.15 | 24.89 |
| කොටස්කරුවන්ගේ සම කොටස්වල ප්‍රතිලාභ | % | 1.37 | 4.44 | 16.80 | 22.05 | 13.67 |
| දළ ලාභ අනුපාතය | % | 4.74 | 11.80 | 17.04 | 17.24 | 13.96 |
| ශුද්ධ ලාභ අනුපාතය | % | 4.30 | 1.83 | 7.35 | 7.83 | 3.22 |
| ජංගම වත්කම් අනුපාතය/වාර ගණන | | 1.45 | 2.73 | 2.54 | 2.22 | 1.84 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන) | | 1.06 | 2.36 | 1.98 | 1.84 | 1.45 |